**<u>2022 නොවැම්බර් මස 01 වන දින පෙරවරු 9.30 ට</u>**
**<u>මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද</u>**
**<u>මොරටුව මහා නගර සභාවේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව</u>**

**<u>සහභාගීත්වය:-</u>**

1. නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - යූ. ලලිත් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එෆ්. බී. නිලංක සිල්වා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එම්. කුමාර රාජරත්න මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එම්. පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - ඒ. දිපා චාන්දනි ආරියවංශ මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රි ගුණසේකර මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - එම්. සුදර්ශනි ප්‍රියන්ත්රිකා කුරේ මහත්මිය
29. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
30. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
31. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
32. මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
34. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2022.11.01 වන දින විශේෂ මහා සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

"මොරටුව මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලා‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව" සහ "මොරටුව මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූලා‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක

19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව" සළකා බැලීම.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මේ සම්බන්ධව යෝජනාව ලබාදෙමින් ඒ සම්බන්ධයෙන් කිහිපදෙනෙක් ඒ යෝජනාවට අත්සන් කරලා තිබුණා. එම නිසා මෙම යෝජනාව සම්බන්ධයෙන් අද දිනයේදි විගණන විමසුමකට සාකච්ඡාවක් ලබාදිම සිදුකිරිම වගකිමක් ලෙස සලකන නිසා මහා සභාවකදි සාකච්ඡාවකට ලක්කළත් විගණන විමසුම සම්බන්ධයෙන් අවසානයේ ඡන්ද විමසිමක් සිදුකිරිමට ඉඩකඩක් ලබා දෙන්නට හැකියාවක් නොමැති වෙනවා. හේතුව විගණන විමසුම කියන්නේ අවසානයක් නොවන දෙයක් නිසා අවසානයක් නොමැති දෙයකට බෙදිමක් කරන්න පුළුවන්කමක් නැහැ. ඒක පනතේ කොතැනකවත් නැහැ. අතුරු ව්‍යවස්ථාවල කොතැනවත් නැහැ. හේතුව නිශ්චිත වෙන්නාවූ කාරණයක් සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයක් නෙමෙයි මේ තියෙන්නේ. මෙහි තියෙන්නේ යම් යම් අදාල වෙන්නාවූ යම් යම් කාරණා සම්බන්ධයෙන් ගයිඩ්ලයින් එකක්. මෙය මෙහෙම කළොත් මෙහෙම කරගත්තැහැකි වැරැද්ද වුනොත් ඒ අදාල වෙන්නාවූ ඒ වැරැද්ද තියෙන කෙනාට ඒකට කරන්නාවූ යම් කිසි මූල්‍යමය දණ්ඩනයක් තියෙනවා නම් ඒකට යටත්වෙලා කටයුතු කරන එක තමයි මේ කටයුත්තේ තියෙන්නේ.

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, විශේෂයෙන්ම විපක්ෂයේ යෝජනාව ඉදිරිපත් කරමින් මේ විශේෂ මහා සභාවට මම හිතනවා විපක්ෂයේ කවුරුහරි මේ සම්බන්ධයෙන් පළමුවෙන්ම ආරම්භ කිරිමේ කථාව ඉදිරිපත් කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 2021 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් වර්ෂය සඳහා අපේ විගණන වාර්තාව සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් තියෙනවා. ඒ සම්බන්ධව කථාකරන්න කැමතියි. පළමුවෙන්ම මම කියන්න ඕනෑ අපේ නගර සභාවේ වත්කම් දේපල සහ අපේ උපකරණ පිළිබඳව. අපි ක්ෂයවීම් එහෙම වෙන් කරලා නැහැ. ඒනිසා අපිට ඇත්තටම සත්‍ය වත්කම් ගැන අවබෝධයක් නැහැ. එතන ප්‍රශ්නයක් තියෙනවා. අපි නිරාකරණය කරන්න ඕනෑ. දේපල ප්‍රත්‍යාගණනය කරලා නැහැ. විස්සයි විස්සේ ඉඳලා ප්‍රත්‍යාගණනය කරලා නැහැ. ඒ හේතුව මත අපිට සත්‍ය වත්කම් අපිට තාම හරියට අවබෝධ කරගන්න බැහැ. ඒනිසා ඒක අපි නිවැරදි කරගන්න ඕනෑ හේතු තිබ්බා. නමුත්, මේ අවුරුද්දේ මම හිතනවා 2022 වෙනකොට අපිට එහි යම්කිසි ප්‍රගතියක් ඇති කියලා. ඒවගේම මම පිටු අංක 5 ට යනවා. එහිදි ඌ ඡේදය කියවන්න කැමතියි. එහි තියෙනවා අපේ ගිණුමක 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම අනුව බැර ශේෂයන් තියෙනවා 74 ක්. එහි වටිනාකම එක්ලක්ෂ හතලිස්දාහයි. නමුත්, ඒක කවුරුන් විසින් ගෙව්වාද කියන එක හොයාගන්න බැරුව එක ෆ්ලෝට් එකේ තියෙනවා. ඒ ශේෂය නමුත් මෙතනදි පැහැදිලි කිරිමක් කරනවානම්

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මම හිතනවා විශේෂ මහා සභාවක් වුනාට මම හිතන්නේ පිළිතුරු කථා දිදී කරන්න පුළුවන් සාකච්ඡාවක් නෙමෙයි මේ විගණන විමසුම. ඔබ අහන ඒවාට අදාල වෙන්නාවූ පිළිතුරු දුන්නේ නැත්නම් මෙය නිකම් අර සභාවේ මන්ත්‍රිවරු කිව්වා ඒනිසා තිබ්බා අපි ඉවර කළා එහෙම එකක් වෙන්න ඕනෑ නැහැ කියලා මම විශ්වාස කරනවා. කාලයත් එක්ක ඔබ අහන දෙයට උත්තරය දි දී යන්නම වෙනවා. එහෙම ගියේ නැත්නම් මෙය නිකම් සභාවක් තියෙන එක ඕනෑ නැහැ වගේ වෙනවා. අවසානේදි තේරුමක් නැති වෙනවා.

ගරු මන්ත්‍රිවරුනි, මෙහි මධ්‍යම වෙළඳපොලේ කඩකුලි අයකිරිමක් කරලා තියෙනවා. වැඩි කිරිමක්. ඒ වැඩි කරපු එක නැහැ අපි එහෙම කරන්නේ නැහැ අපි ගෙවන්නේ පරණ ගානම තමයි කියලා ඔවුන් මෙය බැංකුවට ගෙව්වා. බැංකුවට ගෙවපු එක, අපි පිළිගන්නේ නැති නිසා බැංකුවේ තියෙනවා. අපි ඒක ගන්නේ නැහැ. ගත්තොත් අපි ඒක පිළිගැනිමට ලක්වෙනවා. ඒ තමයි මේ තියෙන ගාන.

**<u>මහා නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, එතකොට අපි බැංකුවෙන් විස්තර ගන්නේ නැහැ එහෙන්ම ම තියෙනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්තුමිය, මුදල අපි ගන්නේ නැහැ. බැර කර ගන්නේ නැහැ. බැර කර ගත්තොත් ඔවුන් ගෙවපු එක හරි වෙනවා. ඔවුන් කියලා තියෙන්නේ ගෙවපු අය ඉන්නවා. සමහර කොටසක් ඒක කෙලින්ම ගිහිල්ලා බැංකුවට ගෙවලා අපි ගෙවන්නේ පරණ ගණන් කියලා ඒක තමයි මේ ගාන.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ හේතුව මත අපි බැර කරගන්නේ නැහැ. අනිත් එක පිටු අංක 6 (ඌ) ඡේදයේ තියෙනවා මධ්‍යම වෙළඳපොල කඩකුලි ශේෂයන් පොදු වෙළඳපොල කඩකුලි ශේෂයන්ගෙන් සමාලෝචිත වර්ෂය සඳහා හාරලක්ෂ තිස්එක්දහසක් අපි කපා හරිනවා. නමුත්, ඒ කපා හැරලා ගිණුම්ගත කරලා නැහැ. ඒනිසා ඒක පෙන්නුම් කරනවා. අපිට ලැබිය යුතු දෙයක් හැටියට. මොකද ඒක කපා හැරලා තියෙනවා. ඇයි ඒක ඒ වෙලාවට ගිණුම්ගත වෙලා නැද්ද?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, යම් දේපලක්, යම් මුදලක් කපා හැරිමට ලක් කළාම පළාත් සභාවේ අනුමැතිය ලබා ගතයුතුයි. අනුමැතිය ලබා ගැනිම සඳහා වෙන්නාවූ කාරණයේ දි අනුමැතියට යවලා තියෙන්නේ. අනුමැතිය එනතුරු කපාහැරිම පෙන්නුම් කරන්න බැහැ. මේ උත්තරයත් අපි විගණනයට යවලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 8 (V) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අපි අධිභාරයක් හැටියට ගෙවිය යුතුයි මිලියන 1.5 ක්. ඉන් අපි මිලියන එකයි අසූඅටක් ගෙවනවා. ඉතිරිය තාම ගෙවලා නැද්ද? මම හිතන්නේ මුදල් කමිටුවෙත් අපි කථා කළා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ගෙවීම් කරගෙන යනවා. තව මම හිතන්නේ මේ අවුරුද්ද අවසාන වෙනකොට ගෙවලා ඉවරයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, එතකොට මේ අවුරුද්දේ 2018 සිට 2022 දක්වා EPF ටික හරියට යනවාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, දැන් හරියට යනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම නැවත මතක් කිරිමක් කරන්න ඕනෑ නැහැ කියලා හිතනවා මේ අපේ සැලසුම අනුමත නොකිරිම නෙමෙයි. මිලියන එකොළහක් අපි ගෙවනවා වන්දියක් හැටියට. මුදල් ආපහු එකතු කර ගැනිමක් කරලා නැහැ වගකිව යුත්තන්ගෙන් මේ සම්බන්ධයෙන් ඔලිවර්ගේ ප්‍රශ්නය. එය තවම යනවා මේ විගණන වාර්තාවේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, විගණන වාර්තාවේ යනවා මේ වෙකොට CLG එකට යවලා තියෙන්නේ පරික්ෂණය පවත්වලා ඉවර කරලා එවන්න කියලා. තාම පරික්ෂණ වාර්තාව ලැබිලා නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 10 වරිපනම් බදු සම්බන්ධව තියෙනවා. අපිට ඇස්තමේන්තුගත මුදල මිලියන 257 ක් හිඟ මුදල සම්බන්ධයෙන් කථා කරන්නේ. ඒවගේම අපේ හිඟ මුදල ඇතුලත තියෙනවා රු.50000 ක වැඩියෙන් වරිපනම් බදු ගෙවිය යුතු කණ්ඩායම් ඉන්නවා 361ක්. එක් මිලියන 91ක් වෙනවා. එතනදි ඒක තාම හිඟ හැටියට තියෙනවා. නමුත්, ඒ මිනිස්සු අපිට ගෙවනවාද නැත්නම් ඉදිරියට ඒවා ලබා ගන්න කටයුතු කරනවාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, රාජ්‍ය ආයතන තමයි ගොඩක් තියෙන්නේ. මේ මුදල ගත්තාම වරිපනම් බදු එන්න තියෙනවා මෙහි කාලය මොකක්ද කියන එක දන්නේ නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ ලක්ෂ දෙදහස් එකසියයක් මෙහි තියෙනවා. ඊට පස්සේ තියෙනවා ඔක්කොම මුදල එකතුව ලක්ෂ දෙදහස් නවසිය හැත්තහයක් තියෙනවා. මේ ඔක්කෝම වල ගත්තාම ඔබතුමිය කියන කාරණයේදි ආයතන තුන්සිය හැටකින් එන්න තියෙනවා සමස්ථ මුදල ගත්තාම සියයට හතලිහක් හතලිස්පහක් එන්න තියෙන්නේ තුන්සිය හැටඑකකින් පනස්පන්දාහක් කියන දේපල සංඛ්‍යාවෙන් තුන්සිය හැටඑකකින් තමයි සියයට හතලිස්පහක් විතර එන්න ඕනෑ. ඒවා තියෙන්නේ රජයේ දේපල. ඒ අදාල වෙන්නාවූ කාර්යයන් සඳහා විධිමත් වෙන්නාවූ ක්‍රියාමාර්ග ගන්න කියලා මම කොමසාරිස්තුමාට උපදෙස් දීලා තියෙන්නේ කපාහරින්න පුළුවන් ඒවා කපා හරින්න. නැත්නම් දේපල තහනම් කිරිමක් කරන්න. මොකද දැන් අපි උදාහරණයකට ගත්තොත් අපි සාමාන්‍යයෙන් වරිපනම් ගෙවන්නේ නැති කෙනෙකුට ඉස්කෝලෙකට යන්න ලියුමක් දෙන්නේ නැහැ. වරිපනම් ගෙවන්න කියලා කියනවා. එතකොට රාජ්‍ය ආයතන වල කපා හැරීමක් කරන්න ඕනෑ ද? ඒනිසා ඒවා අයකර ගැනිමේ කටයුත්ත කරන්න. මෙතන රාජ්‍ය දේපල තමයි විශාල වශයෙන් තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 11 තියෙනවා හිඟ වරිපනම් ශේෂය අතරින් මිලියන 6.3 ක් සමාලෝචිත වර්ෂයේ දි කපා හැර තිබුණද, ඒ සම්බන්ධව විස්තර අපි විගණනයට ඉදිරිපත් කරලා නැහැ.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, මෙය මම හිතනවා ආයතනයේ තියෙන්නාවූ එක් එක් කෙනාගෙන් අනෙක් කෙනාට මාරු වෙනකොට වෙන්නාවූ නිවැරදි කිරිමක් කරගන්න ඕනේ. හේතුවත් එක්ක යනකොට හේතුව නැතිව විතරක් යවනවා ලිපි ගොනුවල මෙහි තමයි තියෙන වරද. අපි කියමු මුදල් කමිටුවේ ගිය ගමන මුදල් කමිටුවේත් එම ප්‍රශ්නය මම හිතන්නේ රවිනාත් ගුණසේකර මැතිතුමා විමසුවා අපේ ආණ්ඩු පක්ෂයේත් එය විමසීම කරනවා හේතුව තියෙනවා ලිපි ගොනුවේ මුදල් කමිටුවට එනකොට හේතුව එවන්නේ නැහැ. හේතුව එවන්නට ඕනෑ අන්න ඒක අපි නිවැරදි කරගෙන යනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, නිවැරදි කිරිමක් කළ යුතුයි. නැත්නම් හරි නැහැ අපේ සභාවට. පිටු අංක 16 වැටුප් ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් කථාකරනවා. අපි සේවකයන් බදවාගෙන තියෙනවා. අනිවාර්යෙන් අපිට ගතයුතු සේවකයන් ප්‍රමාණය තමයි අරගෙන තියෙන්නේ. නමුත්, අනුයුක්ත කළාට අපිට මේ වැටුප් ප්‍රතිපූර්ණය ලැබෙන්නේ නැහැ. එතකොට ඒක අපේ සභාවේ වියදමක් හැටියට තමයි යන්නේ. අපි වර්ෂයට මිලියන 44 ක් ඒ සඳහා වැය කරනවා. මේ සේවකයන් සම්බන්ධව ලියුම් ලියලා තියෙනවා. අන්තිමට ලියුම යවලා තියෙන්නේ පළාත් පලාන දෙපාර්තමේන්තුවට 2020 දි සැප්තැම්බර් වල ඊට පස්සේ අපි මතක් කිරිමක් කරලා නැහැ. මම හිතන්නේ අපි මෙයට උත්සුකවෙලා ලියුමක් යවලා මේ සම්බන්ධව ක්‍රියාත්මක කරලා මෙය පැහැදිලි කරගත්තා නම් අපේ මේ වියදම අපිට ඉතුරු කරගන්න පුළුවන් වෙයි කියලා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඒ සඳහා අදාල වෙන්නාවූ ආයතනයට දිගින් දිගටම දැනුවත් කරලා පසුකාලීනව ඒක අදාල වෙන්නාවූ අමාත්‍යවරයාටත් යැව්වා. දැන් අපිට තියෙන්නේ අමාත්‍යවරයාගෙන් කාඩර් කොමිෂන් වැටුප් කොමිෂන් එකට යන්නට ඕනෑ මේ තත්ත්වය නිර්මාණය කරගන්න. මොකද පළාත් පාලන ආයතනය නෙමෙයි 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ එවකට හිටපු ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා මඟින් දින 180 සම්පූර්ණ කරන්න කරපු අයව ස්ථිර කරන්න කිව්වාම ඒ ස්ථිර කිරීම යටතේ තමයි මේ ස්ථිර වීම වුනේ. එතකොට ඒ ඒ චක්‍රලේඛනය, ඒ ඒ ගැසට් පත්‍රවලින් යම් යම් කාරණාවලදී ඒ කටයුත්ත කළා. ඒ කරපු කටයුත්තේදී ඊට පස්සේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ සියලුම ස්ථිර කිරීම් අත්හිටෙව්වා. අත්හිටවපු එක තමයි පසුකාලේ දිගින් දිගටම මෙය කිව්වත් පළාත් පාලන ආයතනය වෙනුවෙන් පෙනී සිටින්නාවූ පළාත් සභාවත් උඩින් තියෙන නියෝග වලට අපි උඩින් තියෙන නියෝග 1, 2, 3 වලටත් සමහර වෙලාවට යටත් නොවන විදියට කටයුතු කරනවා. පනතේ තියෙනවානම් අපි යටත්නොවී කටයුතු කරනවා. නමුත් සමහර ආයතන එහෙම යටත් නොවී කටයුතු කරන්න බැරිවෙන විදියට පත්වෙනවා. උදාහරණයට පළාත් සභා ගත්තාම අද පළාත් සභාවක් නැති නිසා නිලධාරීන් උඩින් ඉන්න නිළධාරීන් කියන දෙයට අමතරව ඔවුන්ට තීරණ ගැනීමේ හැකියාවක් නොමැති නිසා මේ ප්‍රශ්නය මතුවෙලා තියෙනවා. අද පළාත් සභාවට මේ තීරණ ගැනීමේ හැකියාව නැති නිසා පළාත් සභා එතනින් එහාට මෙය ක්‍රියාත්මක කරන්නේ නැහැ. මොකද අපිට එවලා තියෙන්නේ මුදල් අමාත්‍යංශයේ චක්‍රලේඛනයක් තමයි 2019 අගෝස්තු මාසේ එවුවේ. එතකොට ඒ සඳහා තමයි අපි එගොල්ලන්ව බඳවා ගැනීම සිදුකළේ. ඉතින් අපි එක නිවැරදි කිරීම කරලා වැටුප් ප්‍රතිපූර්ණය මේ වෙනකොට මම හිතන්නේ මිලියන 71ක් විතර වගේ ගානකට විශාල සංඛ්‍යාවක් වශයෙන් වෙලා තියෙන්නේ. අපි ඒ ප්‍රතිපූර්ණය කර ගැනීමට ඒක පිටුවහලක් වෙනවා. මෙය දෝෂදර්ශනයට ලක් කරලා නැහැ. ස්ථිර කිරීම දෝෂදර්ශනයට ලක් කරලා නැහැ. ප්‍රතිපූර්ණය කරගැනීමයි දෝෂදර්ශනයට ලක්කරලා තියෙන්නේ. ප්‍රතිපූර්ණය කරගැනීම අපිට බලෙන් කරගන්න පුළුවන් දෙයක් නෙමෙයි. ස්ථිර කිරීම වෙලා නැතිවුනා නම් ඒක විගණනය වුනානම් ඒක අපේ වරදක් නිසා ස්ථිර කරන්න ඕනෑ අයට ස්ථිර කලේ නැත්නම් ඒක අපේ වරදක්. අපි ස්ථිර කරලා තියෙනවා. ප්‍රතිපූර්ණය කිරීම ආණ්ඩුවෙන් කරන්න ඕනෑ දෙයක්. ඒ වෙනුවෙන් පෙනී සිටිනවා අපි තාම ඒක අතහැරලා නැහැ. ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට කවදා හෝ ඒ ටික ලබා ගන්න පුළුවන්.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, පුළුවන්

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 18 වාහන සම්බන්ධයෙන් කථාකරනවා. අපේ වාහන 19 ක් තියෙනවා ආදායම් බලපත්‍රය නොමැතිව. ඒවගේම වාහන 13 ක් තියෙනවා රක්ෂණය නැතිව. එතකොට මේ රක්ෂණය නැතිව අපි වාහන භාවිතා කරනවාද ගිනි තියන්න කලින් මේ විගණනය කරලා තියෙන්නේ. ඒ වාහන අපි භාවිතා කරනවාද?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, වාහන භාවිතා කරනවා මම හිතන්නේ අපි මේ වෙනකොට සියලු දේවල් අපි සම්පූර්ණ කරලා තියෙන්නේ. මේ වාහන සමහර ඒවා භාවිතයෙත් නැති උදාහරණයට රවිනාත් ගුණසේකර ගරු නගරාධිපතිතුමාගේ කාලේ අපිට ෆයර් මැෂින් එකක් හම්බවුනා. ඒ ෆයර් මැෂින් එක ආවාට පස්සේ අපේ කාලේ එහෙම එකක් තියෙනවා. ආවාට පස්සේ ලිපි ලේඛන නැහැ. අපිට ජපානෙන් එවනවා ඒවා විධිමත් පරිදි ඇවිල්ලා නැති නිසා ලිපි ලේඛන ගන්න බැහැ කස්ටම් එකෙන්. කොලයක් නිකුත් කරන්න ඕනෑ මෙරටට මේ ඇන්ජින් එක මේ චැසි නම්බර් එක සහිත වෙන්නාවූ වාහනයක් නැත්නම් ලියාපදිංචි කිරීම මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් කරන්නේ

නැහැ. ඒනිසා ඒ වගේ වාහන කිහිපයක් මෙතන තියෙනවා. ඊට අමතරව ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා මේ විමසුම එන්නේ අපේ හිටපු කොමසාරිස්තුමා මෙහෙන් යන්නේ පළාත් මෝටර් රථ කොමසාරිස් විදියට. එයා දන්නවා මෙහි මොකක්ද නැත්තේ මොකක්ද තියෙන්නේ කියලා. එතුමා ඉන්නකම් මෙයට වගකීමක් දරන්නේ නැතිව එතුමා ගිය ගමන් ඕඩිට් එකට ලිව්වා. මෙන්න මෙහෙමයි මෙහෙමයි තියෙන්නේ කියලා ලිව්වා. ඒහි ප්‍රතිඵලයක් විදියට තමයි විගණනය වෙන්නේ. විගණනය දන්නෙත් නැහැ. මේ දේවල් එතුමා පළාත් මෝටර් රථ කොමසාරිස් වෙලා තමයි ගියේ. ගිය ගමන් ලිව්වා. ඔන්න ඕක තමයි ඇත්ත දේ. කොමසාරිස්වෙලා ඉන්නකම් මේ ඔක්කොම තිබුණා. හාත් නැහැ. හූත් නැහැ. මතකත් නැහැ. හැබැයි ගියාට පස්සේ ලිව්වා. දැන් ඒකට මේ නිලධාරින්ට වගකීමක් ගන්නත් බැහැ. සමහර මැෂින් ඇත්තේත් නැහැ. සමහර ඒවා මේ වෙනකොට වෙන්දේසි කරලා තියෙනවා. අපි දැනට උත්තරය ලියලා තියෙන්නේ. විගණනයට උත්තරය පිළිගැනිමට ලක්වෙනවාද බලන්න ඕනෑ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මෙය නිවැරදි කලයුතුයි. නිවැරදි කරලා මේවා මෙතනින් ඉවත් වියයුතුයි. විගණන වාර්තාවෙන් නැත්නම් අපි වාහන රක්ෂණය නොකර වාහනයක් දාලා ඇක්සිඩන්ට් එකක් වුනොත් නැවත සභාවට තමයි ඒ වියදම. ඒනිසා මේක නිවැරදි කලයුතුයි.

ගරු නගරාධිපතිතුමනි, අපි නිලධාරින් 14 දෙනෙකුගෙ ණය වලින් රු.99000 ක් වැඩිපුර අයකරලා තියෙනවා. මේ කට්ටියව හොයා ගන්න බැහැ. මේගොල්ලන්ගේ ඩිටෙල්ස් හොයනවා.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, අයකරපුවා වගේම අයවෙන්න තියෙන ඒවා සම්බන්ධයෙන් දැන් මේ වෙනකොට ලිපි යවලා තියෙන්නේ. අපි වැඩිපුර ගත්ත අයගෙන් දෙන්න කියලා ලියුමුත් එවලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇයි මේ වැඩිපුර ගන්නේ අපි.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, සමහර සේවකයෝ ඉන්නවා වැඩ තහනමට ලක්වුන. සමහර සේවකයෝ ඉන්නවා සමහර වේලාවට සේවා ස්ථාන මාරුවෙන. ඒ තුළ ඔවුන්ගෙන් කපපු මුදල් ගෙවන්න තියෙන ඒවා තියෙනවා. ඒවා හඳුනාගෙන දැන් ඔවුන්ට ගෙවීම් කරනවා. ඒවගේම එන්න තියෙන ඒවාටත් ලේඛන යවලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, විගණනය කියලා තියෙනවා අපිට ලිඛිත සාක්ෂි නැහැ කියලා පුස්තකාලේ පොත් සම්බන්ධව. අපේ තොග සම්බන්ධව ඇයි මේ ලිඛිත සටහන් නැතිවෙන්නේ. මෙය හොයාගන්න බැරිද විගණනයට දෙනකොට ඇයි මේ වගේ අඩුපාඩු තියන්නේ.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට මම විශේෂ වු කාරණයක් කියන්නම් ඕලිවර්ගේ ලක්ෂ එකසියහත ගැන කථා කළානේ, අපේ මේ විගණනය වුනත් මේ ලංකාවේ පාර්ලිමේන්තුව සම්මත කරන්නාවු අණපනත් එක්ක ඕනෑ විගණනය කරන්න. අපිව විගණනයට ලක්කරන්න ඕනෑ අපේ පනතත් එක්ක. ඒකට සාපේක්ෂව ඇදාගන්න පුළුවන් යම් යම් දේවල් තියෙන්න පුළුවන්. ඒවා පනතත් එක්ක ගැටෙන්නේ නැති ඒවා වෙන්න පුළුවන්. ඔබතුමිය කිව්වානේ ඕලිවර්ගේ ලක්ෂ එකසියහත ගැන. ඔය ලක්ෂ එකසියහතේ අපි සාක්ෂි විමසිම කළා අපිට සරල උත්තරයක් දුන්නා. එතනින් පස්සේ උසාවියට යන්නත් බැරි ගානට උත්තරයක් දුන්නා. මේ කාලාවරෝදය අහෝසි වෙලා ඇත. ලිපිගොනුව සොයාගැනිමට නොහැක කියලා අධිකරණයෙන් අපිට ලියුමක් එවුවා. යුධ

එකට යැවුවා. යුඩී එකේ සාක්ෂියක් නිසා අපිට මේ ලක්ෂ එකසියහත ගෙවන්න වුනේ. යුඩී එක මොකක්ද මෙයට කියන්නේ කියලා. කාලාවරෝදය පැනලා ඇත ලිපි ගොනුව නැත. අපේ නගර සභාව කරන්නේ හැමතිස්සේම කාලාවරෝධය පැන්නත් පොඩ්ඩක් ඉන්න බලන්න තියේද කොයිහරි කියලා කියනවා. ඔය කියන එකත් එක්ක තමයි මේ සියලුම ගැටුම් වෙලා තියෙන්නේ. දැන් මෙය වෙලා තියෙන්නේ මේවා උත්තරය බැන්දාම විගණනයට පුළුවන්කමක් නැහැ අධිකරණයයි යුඩී එකත් අපිට කියනවානම් කාලාවරෝදයත් එක්ක විගණනය කරන්න බැහැ. නමුත්, අධිකරණමය කටයුත්තකදී අධිකරණය කියපු එකක් මම මේ කියන්නේ. යුඩී එක කියපු එක මම මේ කියන්නේ. අපිට මෙහි කොපියක් දෙන්න කිව්වාම දෙන්නැ. මොකද මෙහි අපිට පොඩි සාක්ෂියක් තිබුණා යුඩී එක කියනවා ගැසට් කරලා නොමැති පාරකට විථී සිමාවල් තියන්න බැහැ කියලා. ඒනිසා තමයි ඕලිවර් ඒක දින්නේ. හැබැයි යුඩී එකෙන්ම අපිට කියනවා මේ පාර මේ පාර විථී සිමා මේච්චරයි කියලා ගැසට් කරලා තියෙනවා. ගැසට් එක තමයි එවලා තියෙන්නේ කියලා. ඒක කටඋත්තරයට දුන්නේ නැහැ. ඒක විමසිමට ලක්කරලා අපි ඒක කිව්වා. මේ අයකර ගැනිම කරගන්න නඩුව ආපහු අලුත් කරගන්න සාක්ෂිය වැරදි සාක්ෂියක්ද කියලා බලන්න. එතකොට කිව්වා කාලාවරෝදයට යටත්වි ඇත. ඒනිසා දෙන්න බැහැ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්න කැමතියි මේ විගණන වාර්තාවේ තියෙන්නේ සමාලෝචිත වර්ෂයට පමණක් අවශ්‍ය ගණුදෙනු නෙමෙයි. 1998, 2003, 2015 ඒ වර්ෂය සඳහා අදාල වන්නාවූ ගිණුමුත් තියෙනවා මෙහි. ඒනිසා මම කාරුණිකව ඉල්ලනවා Account Branch එකටයි Audit Branch එකටයි මිට වඩා ලොකු වගකිමක් තියෙනවා මේ ටික පුළුවන් ඉක්මණට නිරවුල් කරලා මෙතනින් ක්ලියර් කරන්න. ලබන අවුරුද්දට ඔඩිට් රිපෝර්ට් එකට එනකොට හොඳ පිරිසිදු ඔඩිට් රිපෝට් එකක් එන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, හැම වසරකම පෙර වර්ෂයේ ඕඩිට් රිපෝර්ට් එක අපි සාකච්ඡා කරනවා. ගිය වර්ෂයේත් අපි සාකච්ඡා කළා. ඊට පෙර වර්ෂයේත් සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරපු කරුණු එලෙසින්ම මේ වාර්තාවෙත් වැඩි ප්‍රමාණයක් ඇවිල්ලා තියෙනවා. අපිට තේරෙන්නේ නැහැ ඇයි එහෙම වෙන්නේ කියලා. වර්ෂයක් පාසා වර්ෂයක් යනකොට අපේ අඩුපාඩුකම් තියෙනවානම් අනිවාර්යෙන්ම අපි ඒවා නිවැරදි කරගත යුතුයි. නැත්නම් සභාවක් හැටියට අපි යන්නේ කොතැනටද කියන එක සම්බන්ධව ලොකු ප්‍රශ්ණාර්ථයක් තියෙනවා. මේ වාර්තාවෙන් අපිට පේනවා අප සභාවේ මුල්‍ය ක්ෂේත්‍රය තුළ තියෙන පිරිහීම, මුල්‍ය ක්ෂෙත්‍රය තුළ තියෙන කඩා වැටිම, නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකරමින් මේ යන ගමන තුළ ඒවගේම කළමනාකරණය විසින් ඒ නිලධාරින් අතපසු කිරිම් තුළින් සභාවට වෙන හානිය මේ හානිය අපි නැවත ඒ නිලධාරින්ගේ වගකිමක් හැටියට ඒගොල්ලන්ගෙන් අපි ලබා ගතයුතු දේ ලබා නොගෙන වැරදි නිවැරදි කර නොගෙන ඉතාමත්ම නරක කළමනාකරණයක් පරිපාලනයක් මේ වාර්තාව තුළින් පැහැදිලි වෙනවා. කාටත් පෙනෙන දෙයක් මෙය. කොලේ වහලා ගහන්නවත් එහෙම දෙයක් නෙමෙයි. පිටු අංක 11 3(2) කරුණ කළමනාකරණ අකාර්යක්ෂමතා වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් පොදු මුරපදය පිටු අංක 11 කළමනාකරණ අකාර්යක්ෂමතා යටතේ වරිපනම් අංශයේ පරිගණක සේවයට යොදවා ඇති සේවකයන් විසින් පොදු මුරපදය භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10කදි 105893 වටිනා බිල් පත් අවලංගු කර මේ කරුණ ගිය වර්ෂයේත් ඕඩිට් රිපොර්ට් එකේ ආවා. නමුත් අපිට මේ වර්ෂයේත් මේ ආකාරයට වාර්තාවේ එනවා. මෙයට ගත්ත ක්‍රියාමාර්ගය මට මතකයි ගිය වර්ෂයේ මේක ටිකක් ගැඹුරින් සාකච්ඡා කළා. මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙනවා කියලා පොරොන්දු වුනා. නමුත් මේ වර්ෂයේත් ඒ ආකාරයෙන්ම ඇවිල්ලා තියෙනවා. මෙයට අපි කියන්න ඕනැ කාගේ වරදක්ද? කළමනාකරණයේ වරදක්ද? පරිපාලනයේ දුර්වලතාවයක්ද? මොකක්ද මේක අපි හඳුන්වන්නේ. අපි මෙය තරහටවත්, කේන්තියටවත් නැත්නම් පෞද්ගලික වෛරයක් තකා කරන කාරණයක් නෙමෙයි. මහජනතාවගේ මුදල්.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔය වාර්තාවේ නැහැ. අපිට පරික්ෂණ පවත්වන්න බැහැ. කළමනාකරණ සහකාරවරයෙක්ගෙන් වෙච්ච වරදක්. ඒකට අදාල වෙන්නා වු ආයතනයට යවලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙය වරදක්ද නැත්නම් ඕනෑකමින් කරපු වංචාවක්ද?

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, වංචාවක් හරි මොකක්හරි අපිට කරන්න බැහැ පරික්ෂණ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මේවා මෙතනට එන්න ඉස්සෙල්ලා නිරාකරණය කරගත යුතුයි කියන මතය තමයි අපිට තියෙන්නේ.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, එහෙම නිරාකරණය කරගන්න පුළුවන්නම් කොච්චර හොඳ ද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම. එය කාගේ වරදක්ද අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා මිලියන 88 ක් විෂයන් 10 ක් විගණනයේදි සතුටුදායක ලෙස නිරික්ෂණය කිරිමට නොහැකි විය. මෙහි කාගේද අඩුව. ගිණුම් ක්ෂේත්‍රයේ තියෙන දූර්වලතාවයන් නෙමෙයිද, පරිපාලන නිලධාරියා විධායක නිලධාරියා හැටියට ඔබතුමානේ මෙහි වගකිම භාරගන්න ඕනෑ. මේ සම්බන්ධව ඔබතුමා කිසිදු පරික්ෂණයක් හෝ සාකච්ඡාවක් කරලා මෙය විසදගන්න පියවර අරගෙන නැද්ද?

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, පියවර අරගෙන තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට පේනවා මේ කඩා වැටිම ඒවගෙම බලන්න ඔබතුමා පිටු අංක 4 මේ හැම කාරණාවක්ම තියෙන්නේ මූල්‍ය ක්ෂේත්‍රයේ කඩා වැටිම ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්. අපි ලැබිය යුතු දේ ලබා ගන්නෙත් නැහැ. ගෙවිය යුතු දේ ගෙවන්නෙත් නැහැ. සැහැල්ලු කසල ඉවත් කිරිම කාරණා 13ක් තියෙනවා. I – XIII දක්වා ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ලැබිය යුතු ගිණුම් යටතේ සැහැල්ලු කසල ඉවත් කිරිම වෙනුවෙන් සහා බල ප්‍රදේශයේ ආයතන 763කින් ලැබිය යුතු රුපියල් මිලියන 48ක් හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂ තුල අයකර ගැනිමට කටයුතු කර නොතිබිණි.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා ඉස්සෙල්ලා කරුණු 10ක් අඩංගු කරලා ලක්ෂ 888ක් සම්බන්ධයෙන් කථා කළේ. ඒ කාරණයේදි අපේ නිළධාරින් විසින් ලබාදෙන උත්තරය මොන විදියටවත් සෑහිමකට පත්වෙන්නේ නැහැ කියලා තමයි එවන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙහි ආදායම, ආදායමක් කියන්නේ අපිට ලැබිය යුතු මුදල. එතකොට මෙය අනිවාර්යෙන් ලැබෙන්න එපැයි. මෙය ලබා ගැනිම සඳහා අපි දියත් කරලා තියෙන වැඩ සටහන මොකක්ද? මම මේ කථා කරන්නේ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ සැහැල්ලු කසල ඉවත් කිරිම වෙනුවෙන් සභා බල ප්‍රදේශයේ ආයතන 763ක ලැයිස්තුවක් අපි ළඟ තියෙනවා. මේ මුදල් ටික ලබා ගැනිම් සඳහා. මෙය ගිය වර්ෂයේත් ආවා අඩු වැඩියෙන් ඇවිල්ලා

තියෙනවා. මිලියන 48ක් ලොකු මුදලක් 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයට අදාලව අයවිය යුතු රුපියල් මිලියන 36ක් ඇතුලත්ව තිබ්ණි. එරියස් එකකුත් තියෙනවා. එතකොට මේ වර්ෂය සහ පෙර වර්ෂවල එකතුවක් තියෙන්නේ. එතකොට මේ දිගුවේ අපි දියත් කරලා තියෙන වැඩ සටහන මොකක්ද කාලෝචිත වැඩ සටහන මෙය ලබා ගැනිම සඳහා එක මොකක්ද කියන එක පැහැදිලි කරලා දෙන්න.

__ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රිතුමා, ඊටත් වඩා අය වියයුතු ආයතන තියෙනවා. ඒකනේ මේ දාලා තියෙන්නේ. විශේෂයෙන්ම සමහර ආයතන තියෙනවා උදාහරණයට අපි ගත්තොත් සැලොන් එකක් වෙන්න පුළුවන් ඒවගේ ආයතන තියෙනවා ඔවුන්ට ණය මුදලක් ලබා ගැනිම සඳහා ආයතන විදියට ලියාපදිංචි කිරිමක් කරලා තනි පුද්ගල ලියාපදිංචියක් කරගෙන ගිහිල්ලා ගන්නවා. හැබැයි එහෙම ආයතනයක් භාවිතයේ නොමැති නමුත් මේ සියලු කටයුතු කරගෙන යාම සඳහා ගන්න ඒවත් තියෙනවා. කොවිඩ් සමයේදි මේවා නොගෙවිමේ කටයුත්ත කරලා අපිට මේ ආදායමක් නැහැ. සමහර ඒවා තියෙනවා ගණනය කිරිම වැරදි. ඒවා සභාව විසින් ගණනය කිරිමේදි ඊයේ පෙරේදා එහෙම ආයතන මහා නගර සභාවට ගෙනල්ලා සාකච්ඡා කළා. උදාහරණයකට බ්‍රැන්ඩෙක්ස් ආයතනය. බ්‍රැන්ඩෙක්ස් ආයතනයෙන් විතරක් තියෙනවා ලක්ෂ 48ක්. ඒ ලක්ෂ 48 ඔවුන් කියනවා අපි කුණු දෙන්නෙත් නැතිව අපිට මේ මිලක් ඇවිල්ල තියෙනවා. ගෙවන්න බැහැ. ඉතින් ඔවුන් එක්ක සාකච්ඡා කළා මොකද මෙය මේ විදියට විගණන කටයුත්තකට විගණනයට ලක්කිරිම සිදුකරනවා. නමුත් අපිට ආයතනයක් විදියට ඔවුන්ට වාර්ෂිකව අය කරන බද්ද ඊළග වර්ෂය දක්වා හිඟ තියෙන කොට අයකර ගන්න ක්‍රමවේද දෙකයි තියෙන්නේ. එකක් ඒ අදාල වෙන්නා වු වර්ෂයේදි අදාල වෙන්නාවු මාසේදි ගෙවුවේ නැත්නම් අධිකරණ ක්‍රියාවලියකට යන්න ඕනෑ. එතකොට බලපත්‍ර ලබා නොදි මේ කටයුත්ත කරන්න ගියාම බ්‍රැන්ඩෙක්ස් වගේ ආයතනයක් මේවගේ ලොකු ආයතන තියෙනවා රැකිරක්ෂාවල් රටේ ඇති කරගෙන ඩොලර් ටිකක් රටට ගෙන ආයතන තියෙනවා. මේ ආයතන විසින් කියනවා මේ මුදල් ගෙවිම සඳහා අපිට සේවාවක් වෙන්නේ නැති නිසා ගෙවන්න බැහැ කියලා. එතකොට අපි ඔවුන් එක්කත් සාකච්ඡා කරලා සමහර ඒවා කපා හැරලා දැම්මා. දැන් අපි ඊළඟට ලියනවා උත්තරය ඔවුන්ට වෙළඳ බලපත්‍රය ලබා ගන්න ඕනෑ. වෙලද බලපත්‍රය ලබා නොගෙනිම තුල ආයතනයක් විදියට පිලිගැනිමට ලක්වෙන්නේ නැහැ. ඒ ඔවුන් විසින් ගණුදෙනු කරන්නාවු විදේශ රටවල් ඒක නිසා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා මොකද එකවුන්ටන් මහත්තයා මේ වෙලාවේදි විශේෂයෙන්ම කිව්වේ දැන් අපිට වරිපනම් බදු ගෙවන ආයතන විදියට ගත්තාම බ්‍රැන්ඩෙක්ස් ආයතනය වරිපනම් බදු විතරක් ගෙවනවා මම හිතන්නේ මුලු ඔක්කොම ගත්තාම ලක්ෂ 100ක් 150ක් විතර අපිට වාර්ෂිකව හම්බවෙනවා. ඔවුන් මොනවා හරි බදු ගෙවාගෙන යනවා. හැබැයි මෙතනදි කසල බද්ද කියන බද්ද අයකර ගන්න පුළුවන් වෙන ප්‍රමාණය නැති ප්‍රමාණයක් අයකරන්න දාලා ගණනයේ මොකක්හරි වරදක් වෙලා එහෙම එකකුත් තිබුණා. හැබැයි ඔවුන්ව ගෙනල්ලා සාකච්ඡා කිරිමේදි අපි නිවැරදි තිරණයකට ආවා. දැන් අපිට පුළුවන් කපා හරින ඒවා කපා හැරලා නැවත පිළිතුර යවන්න.

__මහා නගර සභා මන්ත්‍රි - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා__

ගරු නගරාධිපතිතුමනි, දැන් මෙය එකතු වෙමින් පවතිනවානේ 2012 සිට. එතකොට අපිට මෙහි නිගමනය මොකක්ද ඔබතුමා කියපු කාරණා යම් කිසි සාධනිය කාරණා තියෙනවා. මේ කොවිඩ් එක නිසා වැරදි විදියට අපි ගණනය කිරිම් කරලා තියෙනවා. එතකොට මෙයට අපේ තියෙන විසඳුම මොකක්ද? මෙය නිරන්තරයෙන් ම වෙනවානේ. ගණනය කිරිමේදි වැරදි වෙනවා. මෙය ඒ කාල සිමාවලට අපි දියයුතු සහනයක්. ඒ සහන ප්‍රමාණයන් දිලා.

__ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මන්ත්‍රිතුමා, මීළග සභාවට එනවා සමාලෝචනය කරලා. මේ එකෙන් එක මොකක්ද අපි කළේ කියලා සමාලෝචිත වාර්තාවක් එක්කම සභාවට දාලා අයකරන එක කරනවා.

__මහා නගර සභා මන්ත්‍රි - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා__

ගරු නගරාධිපතිතුමනි, බොහෝම හොඳයි, මොකද ගිය වර්ෂයේ අපි කථා කරලා සාකච්ඡා කරලා විශේෂ සාකච්ඡා කරලා කෙරුනේ නැත්තේ ඔබතුමා සභාව තුළට පරීක්ෂණයක් පවත්වලා ඒ සියලුම කාරණාවලට ඔබතුමා ලබා ගන්නාවූ පියවරයන් මොනවාද කියන එක සම්බන්ධව අපි ඉල්ලීමක් කරනවා. එන සභාවේදි ඔබතුමත් එය පොරොන්දු වුණා ලබා දෙන්න කියලා. මීළගට ගත්තොත් එහෙම පානදුර ප්‍රාදේශිය සභාව කරදියාන කසළ අංගනය යටතේ එතන අපිට එන්න තියෙනවා ලොකු මුදලක්. ලක්ෂ 12ක් විථී පහන් නඩත්තුව හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය මෙය ගිය වර්ෂයේත් කාරණා ඔක්කොම තිබුණා. වර්ෂ ගණනාවක සිට පැවතෙන වරිපනම් බදු වංචා කිරිමෙන් සිදුවූ අලාභය වන රු. 381,000 ක් ශේෂ මුල්‍ය ප්‍රකාශන ජංගම වත්කම ලෙස ගිණුම් ගත කිරිම. එවැනි කාරණා අලාභයෙන් 241000 ක් මේ වරිපනම් බදු වංචාවට වගකිව යුතු නිලධාරියා විශ්‍රාම යැමට නියමිත 2024 මැයි 04 දින අයකර ගැනිමට 2011 පෙබරවාරි 14 දින විනය නියෝගයක් ලබා දි තිබුණි. ඒ සම්බන්ධව ඔබතුමා ගත්ත ක්‍රියා මාර්ගය.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඒ මහත්මිය විශ්‍රාම යනකොට ඒ විශ්‍රාමයේ දි අපිට ගන්න පුළුවන් වෙන ප්‍රමාණය තියෙනවානේ ඒ ප්‍රමාණය ඉක්මවා යන ප්‍රමාණයක් තමයි එය ගණනය කරලා තියෙන්නේ. කපාහැරීම සිදුකරන්න පුළුවන් වෙන්නේ. ඔවුන් විශ්‍රාම යනකොට ගන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවා. ගන්න බැරි ප්‍රමාණයක් තියෙනවා. එය තමයි සඳහන් කරලා තියෙන්නේ. ඒ කියන්නේ වංචාව හඳුනගෙන තියෙනවා. ක්‍රියාත්මක කරන්න තියෙනවා. උදාහරණයකට ගත්තොත් ඔහුගේ ඔබතුමන්ලා කථා නොකර ඉදියිද කියලා මම දන්නේ නැහැ. හැබැයි කථා කරයි කියලත් මම විශ්වාස කරනවා. නන්දසිරි අප්පුහාමි රියදුරු ලක්ෂ 32ක් එතකොට නන්දසිරි අප්පුහාමි වෙනුවෙන් වැඩියෙන්ම කථා කළේ සුනිල් නන්දසිරි මාසකෝරාළ මන්ත්‍රිතුමා එතකොට ලක්ෂ 32 අපි මොකද කළේ සභාවෙන් ලක්ෂ 32 ක්. නන්දසිරි අප්පුහාමිගේ විශ්‍රාම කාලය ඉක්මවා අපිට ඔහුගේ වැටුපෙන් කපන්න බැරිවුණා රු.35යි රු.302 යි දෙසිය ගානයි. ඔහොම තමයි සල්ලි තිබුණේ. එතකොට විශ්‍රාම එකෙන් එක්ලක්ෂ ගාණක්ද කොහෙද කපලා තියෙන්නේ. කවුරුත් දන්නේ නැහැ මෙය අපි ගෙවුවා. දැන් මෙය විගණනය වෙලා තියෙන්නේ. හැබැයි මෙහි මම දන්නේ නැහැ පිළිතුරු යැවිමේදි කොහොම පිළිතුරු යැවුවාද කියලා. මේ බැංකු ගිණුම අපේ අත්හිටෙවුවා ලක්ෂ 32 ගෙවනකම්ම. එතකොට නගර සභාවේ දෛනික වැඩ කටයුතු කරන්න බැහැ බැංකුවත් එක්ක කටයුතු කරන්න බැහැ. ඒනිසා ලක්ෂ 32 සභාව ගෙවුවා. සභාව ගෙවලා ඉතින් සුනිල් නන්දසිරි මන්ත්‍රිතුමා කථාකළා වගේ ආණ්ඩු පක්ෂය කිවුවා කරන්න තියෙනවා නම් හොඳයි. මෙය කපමු පව් අහිංසක සේවකයෙක් එහෙම කියලා කිව්වා. හැබැයි අහිංසක සේවකයාගේ රැකියාව තබාගැනිම සඳහා ලස්සන වැඩක් කළා ඔබතුමන්ලාගේ පාලන කාලේ. ඒ තමයි මේ කියන්න ඕනෑ මේවා විගණනය වෙන්නේ නැහැ. නන්දසිරි ගැන අපි අනුකම්පා කරනකොට නන්දසිරිව බේරා ගැනිම සඳහා හැප්පුනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය. නන්දසිරි දුවනවා ගහන්න ඒනිසා දුවලා දුවලා නන්දසිරි එනවා බාර් එකට. මේ ඇත්ත කථාව. මේ බිලා හිටපු නන්දසිරි අප්පුහාමි ඇතුළුවුණා ඇතුළු වුණාම තිබුණා සුදුපාට අරක්කු වගයක් බිව්වා. ඕනෑකමින් බිව්වා සුදු අරක්කු බිලා කිව්වා මේ වේලාවේ දුවගෙන දුවගෙන හති වැටිලා බලනකොට සුදු අරක්කු පෙවිලා තියෙන්නේ. වාහන එනකොට කිවුවා දැන් පෙව්වේ කියලා අම්බානේට බිලා හිටියේ. ඔන්න පුද්ගලයා බේරගන්න කරපු වැඩේ. අන්තිමේට මොකද වුණේ ඔහු වැරදිකාරයෙක් නොවේ ඔහුට දඩ මුදලක් නියම කරලා රැකියාවේ පිහිටෙවුවා. මෙය විගණනය වෙන්නේ නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රි - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, හිටපු නාගරික මන්ත්‍රි කෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ඉන්ධන ශේෂය වූ රු. 75,000 ක් සමාලෝචිත වර්ෂයේ අයකර ගැනිමට අපොහොසත් වී තිබිණා. 1998 - 2003 කාල පරිච්ඡේදය තුළ රු. 491,000 ක්.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මම දන්න පළාත් සභා මන්ත්‍රිවරයෙක් මම නම කියන්නේ නැහැ. ඔහු පළාත් සභාවට ඇතුළුවුණ ගමන්ම ණය මුදලක් දෙනවා ලක්ෂ 5ක. ඔහු මිය ගියා. මම පළාත් සභාවට ගිහිල්ලා ඒ ණය මුදල කැපුවා. අපිත් හිතුවා නන්දසිරි අප්පුහාමිට මෙය කළොත් විගණනය හැබැයි

ඒ විගණනය වුණේ නැහැ. අපිට වඩා උඩින් ඉන්න නිසා සභාවට තීරණ ගන්න පුළුවන්. අපිට එහෙම තීරණයක් ගන්න බැරි නිසා වෙන්න ඇති විගණනය වෙලා තියෙන්නේ. එහෙම වෙච්ච අවස්ථා ඕනෑතරම් තියෙනවා. ඉතින් මෙහි දී සාමූහිකව අපි ගත්ත ක්‍රියාමාර්ගයට මොකක්හරි උත්තරයක් ගන්න මුළු සභාවම මම හිතන්නේ නිශාන්ත ප්‍රදීනාන්දු මන්ත්‍රීතුමා විතරක් මම හිතන්නේ අපි මෙයට නිහඬ වෙනවා. අපි මෙයට එකඟතාවයක් දෙන්නෙ නැහැ කිව්වා මට මතක විදියට අපි ඔක්කොම එකඟවෙලා මෙය කළේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වාර්තාව කියන එක ගැනනේ අපි කථා කරන්නේ. මේ වාර්තාවේ අඩංගුවෙලා තියෙන කාරණා එතකොට මේ වගේ දෙවල් දැන් ඔබතුමා කියපු කාරණා හෝ වේවා දැන් හිටපු නාගරික මන්ත්‍රීවරුන්ගෙන් රු.75,000 අයවෙන්න ඕනෑ කියන කාරණාව. මෙය මේ යූඑන්පි එකද නැත්නම් වෙනත් පක්ෂයකද කියන එකත් අරගෙන නෙවෙයි අපි පොදුවේ කථා කළා. මෙය මේ වාර්තාවෙන් අයින් වෙන්න ඕනෑ නිදහස් කරන්න ඕනෑනම් නිදහස් කරන්න ඕනෑ යම්කිසි ක්‍රමවේදයන් අනුගමනය කරලා. මෙය හැමදාම හැම වර්ෂයක් තුළම මේ එකම කාරණාව අපි සාකච්ඡා කරනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, නිදහස් කරන්න බැහැනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, රු.75,000 ක් අයකරගන්න මොකක්ද අපිට තියෙන ක්‍රමවේදය.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරයා ඉන්නවා කියලා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකින් සනාථ කරලා ලිපියක් එවුවා. නැහැ නෙමෙයි ඉන්නවා ගම්පහ පැත්තේ. බියගම ප්‍රාදේශිය සභාවේ ඉන්නවා. මෙය විගණනය දන්නේ නැහැ. අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් තහවුරු කරගෙන පදිංචියේ ඉන්නවා. මේ අංකය තමයි. ඔන්න ඔහුගේ හැඳුනුම්පත් අංකය. ඡන්ද හිමි නාම ලේඛනයේ තියෙනවා. ඔක්කොම හොයාගෙන තියෙන්නේ. හැබැයි අපි යවනවා ඔවුන් විසින් කරන්නේ නැතිවුනාම ගන්න ඕනෑ ක්‍රියාමාර්ගය ගන්න ඕනෑ. ඔහුට දැන් අධිකරණ ක්‍රියා මාර්ගයකට ගිහිල්ලා තියෙන්නේ. වෙන මොකක්ද අපි කරන්නේ විගණනය තව අවුරුදු 10ක් 15ක් ගියත් අපි මොකක්ද මේවගේ දේවල් වලට කරන්නේ. ඔබතුමාලා ඔය කියන ඔක්කොම දේවල් මේවායේ තියෙන්නේ මුදල් අයකර ගැනීමනේ. මේ මුදල් අයකර ගැනීමේදී ගණන් බලන නිලධාරියා විදියට මම මේ ඔක්කොම වලට බැඳෙනවා. නමුත් මේ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ඔක්කොම තියෙන්නේ සම්පූර්ණයෙන්ම සභාවක් විදියට ඔබතුමයි මමයි එකතුවෙලා සිදුවෙච්ච කාරණා නෙමෙයි. මේ සියලුම දේ තියෙන්නේ එකම දේ තියෙන්නේ ඔබ මෙතනට එන්න පුළුවන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට මන්ත්‍රීවරු හැටියට මෙතන වැදගත් වෙන්නේ මේ කාරණා වලට යම්කිසි පිළිතුරු දීලා මේ වාර්තා වලින් සාධාරණව අයින් කරගෙන. ඒවගේම වැරදි කරලා තියෙන අඩුපාඩුකම් තියෙන මුලා වංචා කරලා තියෙන පුද්ගලයන්ට නිසි දඬුවම් දීලා මෙය නිදහස් කරන්න. එතකොට මෙය ඇද ඇද යන්නේ නැතිව ඔබතුමා මෙතන විධායක නිලධාරියා හැටියට පුටුවේ වාඩිවෙලා නිලධාරින් හා මන්ත්‍රීවරු එකතු කරගෙන මෙයට අවශ්‍ය පියවර ගන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, කරලා තියෙන්නේ. එය අපි නෙමෙයි ඇදගෙන යන්නේ විගණනය.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නමුත් මෙතන ප්‍රශ්නය තියෙන්නේ මේ එකම කාරණාව එකම විදියට මෙය පොඩ්ඩක් ඔබතුමා බලන්න. කලින් ගෙවීම් සහ අත්තිකාරම් යටතේ දිර්ඝ කාලයක සිට පැවතෙන එකතුව මිලියනයයි. හතරවෙනි කාරණාව සමාලෝචිත වර්ෂයේ සිට අයකර ගැනිමට අපොහොසත්වී තිබිණි. කලින් ගෙවීම් සහ අත්තිකාරම් යටතේ දිර්ඝ කාලයක සිට පැවතගෙන එන එකතුව මිලියනයයි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මේ ප්‍රශ්නය විසඳලා තියෙන්නේ. අය කිරීම කරලා තියෙන්නේ. දන්නලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දිර්ඝ කාලයක සිට පැවතෙන එකතුව මිලියන 4යි දෙලක්ෂ හැටහත්දහස් දෙසිය හැටදෙකක ගෙවිය යුතු ශේෂ හයක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදි අපොහොසත් වි තිබිණි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මේවා තව අවුරුදු 20ක්වත් විගණනයට අහුවෙයි. 1980 ගණන් ඉදලා ඒවා තමයි තියෙන්නේ මේවාට උත්තර දෙන්න බැහැ. නිලධාරින් දන්නෙත් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලසීමාවට අදාලව ලැබිය යුතු මිලියන එකයි පන්ලක්ෂ හයදහස් අටසිය විසිදෙකක එකතු කළ අගය මත බදු වට්නාකමින් කිසිදු මුදලක් අයකර ගැනිමට සභාව අපොහොසත් වි ඇත.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මේ සම්බන්ධයෙන් නිලධාරින් ගිහිල්ලා සාකච්ඡා කිරිමේදී සභාවට වෙන්නා වූ ආවාසියක් පිළිබඳව තමයි ඔවුන් දැනුවත් කිරිම කරලා තියෙන්නේ. එකතු කළ අගය මත කියන එක මීට වඩා ලොකු ගණනයක් තියෙනවා. සභාව විසින් ඒ වෙත නොගෙවපු ඒනිසා මෙහි ලිපිගොනු පරික්ෂා කිරිමේදී සභාවට මේ අයවෙන්නට ඕනෑ වෙන්නාවූ පහළොස්ලක්ෂය කියන එක අපි සම්පූර්ණයෙන්ම අයකර ගන්න යන මුදල වගේ දසගුණයක් විතර වගේ ගුණයක් අපිට ගෙවන්න වෙනවා කියන එක තමයි කියලා තියෙන්නේ. ඒනිසා ඒ පිළිබඳව නැවත නැවත යනවා මොකක්ද කරන්න තියෙන්නේ බලන්න ගියාම ඒකතමයි නිලධාරින් කියලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වැටුප් ප්‍රතිපූර්ණය සම්බන්ධව කාරණාවක් ඒක අපිට ලැබිය යුතු මුදලක් ඒ වැටුප් ප්‍රතිපූර්ණය නොහැකි වෙලා තියෙනවා. තොග ශේෂය තුළ පැවත එන මිලියන 21ක පොදු ගබඩා ශේෂය නිරවුල් කිරිමට කටයුතු කරගෙන නොතිබිණි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මේ අවුරුද්දේ අවසන්කරලා ඉවර කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අනුකූල නොවීම 1.5 යටතේ මුදල් රේගුලාසි 128 පිටු අංකය 19 (8) නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වාගෙන නොතිබිම. 2021 වර්ෂය තුළ ලබාගත් අයිරා පහසුකම් වලට අපි ගෙවලා තියෙනවා නිසි මුලය පරිපාලනයක් පවත්වා නොගැනිම නිසා මිලියන එකයි දෙලක්ෂ අනුහයදහස් හයසිය දෙකක මුදලක් අපි ගෙවලා තියෙනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ මුල්‍ය රෙගුලාසි වලට උඩින් තමයි මෙය තියෙන්නේ. ඒගොල්ලන්ට පෙන්වා දෙන්න පුළුවන් මොකද විගණනය කියන්නේ. අපි පාරේ කෙලින් යනකොට කවුරුහරි ඇවිල්ලා හැප්පුනත් අපි හැප්පුනා කියලා කියන්නේ. ඒ කියන්නේ ආයේ හැප්පෙන්න එපා ඊළඟ එක්කෙනාව බලාගෙන. හැබැයි මුල්‍ය රෙගුලාසිවල මෙය තිබුණාට පනතේ අපිට කියලා තියෙනවා ඕනෑම විදියට අයිරා අරගෙන ආයතනය පවත්වාගෙන යන්න කියලා. ආයතනය පවත්වාගෙන යෑම සඳහා අයිරා ගැනිම පනතේ තියෙනවා. පනත බලවත් මෙයට වඩා. අපි මෙය කිවුවාට ඒගොල්ලෝ පිළිගන්නේ නැහැ පිළිගන්නේ නැති එක නවත්තගෙන මුල්‍ය රෙගුලාසි වලට හිරවෙලා තිබුනොත් ඔබතුමන්ලා කියයි කොවිඩ් කාලේ බොඩි ටික වළ දාන්නේ නැහැ. පුච්චන්නේ නැහැ. මොකක්හරි කරන්නේ නැහැ කියයි. එතකොට අපිට ඒවා ඉක්මවා ගිහිල්ලා අයිරා ගන්න වෙනවා. අයිරා ගන්නේ නැතිව ආයතනය පවත්වාගෙන යන්න බැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මිලියන 11යි හයලක්ෂ දෙදහයි තුන්සියදහඅට ඕලිවර්ට ගෙවපු වන්දිය සම්බන්ධව මෙහි එතුමා ඉල්ලලා තිබ්බේ ලක්ෂ විසිපහක වන්දියක්. නමුත් මේ මුදල මිලියන එකොළහයි හයලක්ෂ තුන්දහයි තුන්සියදහඅටක් පමණ වැඩි වෙනවා. එතකොට මෙහි එතුමාගේ පොලිය කීයද 24%, 25% ක මුදලක්. නමුත් අපිට හැකියාවක් තිබුනේ නැහැ මේ නඩුව තුළදි අපේ නිතිඥතුමාට මේ ගිනි පොළිය අපිට අවම කරගෙන රාජ්‍ය මුල්‍ය ආයතනය මෙයට අදාල වූ පොළිය සම්බන්ධව තිරණයක් අරගෙන මේ පොළි ප්‍රමාණය අඩුකර ගැනිමට අපිට හැකියාවක් ලැබුනේ නැහැ. ඒනිසා තමයි මෙය ලක්ෂ විසිපහක මුදල වන්දිය ලක්ෂ එකසියදහසයක් දක්වා මෙය වැඩි වෙන්නේ. ලොකු අගතියක් සභාව තුළ සභාවේ මුදල් වලට වුණා කියලා ප්‍රකාශ කරමින්, මතක් කරමින් ඔබතුමා එන මාස පැවැත්වෙන අපේ සභා රැස්විම තුළදි මේවා විශාල වශයෙන් තියෙනවා මෙය ඇතුළේ ඔබතුමත් පිළිගන්නවා ලොකු අඩුපාඩු වැරදි දෝෂ තියෙනවා කියන කාරණාව. ඒක තමයි සත්‍යය ඒ සඳහා ගතයුතු පියවර ටික අපිට ලබාදීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම මම හිතන්නේ එතුමා ප්‍රවේශයත් හොඳයි. අවසානයත් හොඳයි. එකම දේ තියෙන්නේ මැතිතුමා අධිකරණයකින් නිශ්චිත වෙන්නාවු මුදලක් ගෙවිමට ලක්කරන්න කියලා. නියෝගය ලබාදුන්නාට පසුව ඉහළම අධිකරණයට ගිහිල්ලා තීන්දුව ලබාගත්තාට පස්සේ අධිකරණය අභිබවා යන්න පුළුවන් තත්ත්වයක් මේ පළාත් පාලන ආයතන වලට නැහැ. අදාල වෙන්නාවු නිතිඥතුමිය මෙතුමාව වගේම, මාවත් මේ කාරණයේදි නොමඟ යැවිමක් කරමින් මෙය දිනන්න පුළුවන් දිනන්න පුළුවන් කිය කියා ඉදිරියට ගියා ඇරෙන්න ඒ අවස්ථාවේදි අධිකරණ ක්‍රියාවලියේදි බේරුම්කරණයක් කරගන්න පුළුවන් ඕනෑම අවස්ථාවේදි බේරුම්කරණය කරගැනිම දෙපාර්ශවයට හොඳයි කියන එක තමයි එතුමිය හැමදාම මට ආයතන කමිටුවේ නඩු සම්බන්ධයෙන් කියනකොට එතුමිය කථාකරනවා මෙයට අපිට උපදෙසක් දෙන නිතිඥවරයෙක් හිටියේ නැහැ. හැමතිස්සේ ම පුළුවන් පුළුවන් කිය කියා අපි දන්නේ නැහැනේ අපේ හිටපු නිතිඥ බ්‍රෝකර් කෙනෙක් කියලා. ඉතින් අවසානයට ගිහිල්ලා නඩු තින්දුවේදි ඒ පොළියත් ගණනය කරමින් තමයි අපිට ගෙවන්න කියලා කිව්වේ. එතකොට අධිකරණය කියන ගාන ගෙවන්නේ නැතිව ඒ වේලාවේ හිටියානම් ඊට තව මාස හයකට පස්සේ ගෙවන්න වෙන්නේ ඊට වඩා ලොකු ගානක් ඉතින් ඊට එහා අපිට කරන්න දෙයක් ඉතිරි වෙලා තිබ්බේ නැහැ අධිකරණය තමයි ගානත් එක්කම කියලා එවුවේ. අපි ගණන් හැදුවේ නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභා ආඥා පනතේ 222 වගන්තියේ තියෙනවා විගණකවරයා ඒ කියන්නේ එකවුන්ටන් විසින් තම විගණනය පිළිබඳ මාසික වාර්තාවක් සභාවට ඉදිරිපත් කළයුතු අතර මුදල් වර්ෂය අවසාන විමෙන් පසුව හැකිපමණ ඉක්මණින් විගණනය පිළිබඳ වාර්ෂික වාර්තාවක් සභාවට ඉදිරිපත් කළයුතුයි. මම මගේ දැනගැනිමට අහන්නේ, මම වැරදි නම්

නිවැරදි කරන්න, මාසිකව විගණනයක් එකවුන්ටන් හරහා නගර සභාවේ සිද්ධ වෙනවාද කියලා දැනගන්න පුළුවන්ද? එතකොට ඒ විමසුම සභිකයන් වන අපිට එවනවාද?

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, විමසුම් වලට උත්තර යවන්න එපැයි. අපි කියමුකෝ උදාහරණයකට විමසුම් එවනවා මාසෙන් මාසෙට. මේ විමසුම් එවුවාම ඒ විමසුම් වලට උත්තර යවනවා. ඒ උත්තර පිළිගන්නේ නැති වුනාම එකපාරටම වර්ෂ අවසානේ වාර්තා එවනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, විමසුම් එවනවා නම් වර්ෂය අවසානයේ දි මේ විගණන වාර්තාව හරහා මේ වගේ ලොකු මහා පරිමාණ වැරදි මතුවෙන්න අර මාසිකව විගණන විමසුමේදි හයිලයිට් වෙනවා නම් කොහොමද මේ තත්ත්වයට පත්වෙන්නේ කියලා. මම හිතන්නේ මට සාධාරණ ප්‍රශ්නයක් තියෙනවා උදාහරණය හැටියට දැන් මේ වාර්තාවේ එක එක සෙක්ෂන් තියෙනවා එක සෙක්ෂන් එකක් මම ගන්නම් ගිණුම්කරණ අඩුපාඩු 1.4 ගිණුම්කරණය සම්බන්ධයෙන් ඒ ලේඛන පවත්වාගැනිම සම්බන්ධයෙන් තියෙන වැරදි වත්කම් ප්‍රතිගහනය කිරිම වත්කම් ක්ෂය කිරිම.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, මාගේ නොදැනුවත්කමින් කියවෙච්ච දෙයක් නිවැරදි කරගන්න ඕනෑ. පනතේ ප්‍රකාරව මාසිකව විමසීම් එවන්නේ නැත. අවසානයේ වාර්ෂිකව එවන එක තමයි කරන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, කවුද එහි වගකීම පැහැරහැරලා තියෙන්නේ.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒගොල්ලෝ කියනවා අපි බැදිලා නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතන ඉන්නේ දේශපාලන අධිකාරිය, ඔතන ඉන්නේ රාජ්‍ය සේවකයෝ මේගොල්ලෝ මාරු වෙනවා. ඔයගොල්ලෝ මාරුවෙන්නේ නැහැ. ඔයගෝල්ලන්ගේ වගකිම තියෙන්නේ රටේ ඉන්න බදු ගෙවන ජනතාවට. මෙතන ඉන්නේ රජ්‍ය නිලධාරින් ඔබතුමන්ලා අපි දේශපාලන අධිකාරිය. අපි අද මෙතන ඉන්නවා ඊළඟපාර ඉන්නේ නැති වෙන්නත් පුළුවන්. එහෙමයි ඒ වුනාට මේ මුදල් කාගේ මුදල්ද, මේ ජනතාවගේ බදු මුදල්. එතකොට අවසානේදි සැම දෙයක් සම්බන්ධයෙන්ම රජයේ බදු මුදල ගෙවන ජනතාවට තමයි සැම රජ්‍ය නිලධාරියෙක්ම වග වෙන්නේ, වගකියන්නේ. මේ රටේ තියෙන ලොකුම ප්‍රශ්නයක් වගකිම සහ වගවිම. අද ලංකාවේ කවුරු ළගවත් වගවිමට වගකිමට කවුරුවත් නැහැ. මේ රටේ හැමතැනම තියෙන ප්‍රශ්නයක් ඕක. මම සෘජුවම අහනවා නගරාධිපතිතුමා දේශපාලන අධිකාරිය නගරාධිපතිතුමා අතින් වැරදි වෙන්න පුළුවන්. රජයේ නිලධාරින්ට වගකිමක් තියෙනවා. ඒවා පෙන්වා දෙන්න. එතකොට මෙතන ඇක්ට් එකේ කියනවානම් විගණකවරයන් විසින් තම විගණනය පිළිබඳ මාසික වාර්තාවක් සභාවට ඉදිරිපත් කළයුතු අතර මුදල් වර්ෂය අවසාන විමෙන් පසු හැකි ඉක්මනින් ඒ විගණනය පිළිබඳ මාසික වාර්තාවක් මාසික විමසුම ඉදිරිපත් නොකිරිම මන්ත්‍රීතුමා අපේද වැරැද්ද, කාගේද වැරැද්ද ?

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, විගණකාධිපතිගේ

**(සභා ඝෝෂා)**

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, නිතිමය සම්බන්ධයෙන් කටයුතු කිරිම නිතියට පටහැනි විෂයක් සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප කළයුතු අතර නීති විරෝධි ගෙවිම් සම්බන්ධයෙන් වගකිවයුතු

තැනැත්තන්ට විරුද්ධව කටයුතු කිරීම නීතිය සහ මෙහි තිබෙන බලතල ප්‍රකාරව කටයුතු කිරීම මෙන්න මේ දේවල් තියෙනවා නම් මගේ ප්‍රශ්නය ඇයි අවසානේ අපිට මේ වගේ රිපෝර්ට් එකක් දකින්න ලැබෙන්නේ. ඒක ඇත්තටම දුකට කරුණක්. මේ සම්පූර්ණ මෙහි තියෙන මූල්‍ය අක්‍රමිකතා සහ වංචා සහ වැරදි සමස්ථ වශයෙන් ගණනය කළොත් මිලියන 500ය 750 එතනින් එහාට මේ දක්වා එනවා. උදාහරණයක් හැටියට ගත්තොත් ගෙවලා නැති වරිපනම් අයකරලා නැති මුදල් මේ සෑම සියලු දෙයක් සම්බන්ධයෙන් ම එකතු කරලා සමස්ථ මූල්‍ය වංචා අක්‍රමිකතා මොරටුව මහා නගර සභාවේ සංඛ්‍යාවක් විදියට ගත්තොත් අතිවිශාලයි. මෙය මිලියන 500ක් 750ක් අතර. ඇත්තටම මේ මහජනතාවගේ මහජන මුදල් තමයි මෙතන අවභාවිතා වෙන්නේ. ඒ සම්බන්ධයෙන් ඇත්තටම මම ඉස්සෙල්ලා කිව්වේ මාසිකව විමසුමක් සිද්ධවෙනවා නම් ඇයි මේ අවස්ථාව වෙනකම් වෙන්නේ කියලා තමයි තියෙන පැහැදිලි කරුණ. එතකොට මේ අංශ ගැන කථා කළොත් මෙතන කියනවා ගිණුම්කරණ අඩුපාඩු මේ ගිණුම්කරණ අඩුපාඩු දේශපාලන අධිකාරිය වන අපි ඔබේ මගේ වගකීම නෙමෙයි ඒවා ආයතන නිලධාරි විසින් කළයුතු දේවල් ගිණුම්කරණ අඩුපාඩු වත්කම් ප්‍රතිගහනය නොකිරීම. මම දන්නවා ඔබතුමා මේවාට උත්තර දීලා තියෙනවා. නමුත් මේවා සම්බන්ධයෙන් වැරදි නිවැරදි කිරීමට කිසිදු ක්‍රමවේදයක් සාධනීය ක්‍රමවේදයක් අරගෙන තියෙනවාද? හේතුව මෙතන මේ තියෙන වැරදි මෙදාපාර මතුවෙලා තියෙන වැරදි විතරක් නෙමෙයි හැම වරදටම තියෙනවා පවත්නා කියලා නව නිරීක්ෂණ නෙමෙයි පවත්නා ඒ කියන්නේ මෙය අවුරුද්දක් අවුරුද්දක් පාසා මෙය දිගටම කන්ටිනියු වෙන වැරදි. මෙය නිවැරදි වෙන්නේ නැත්නම් ඇත්තටම සභාවේ තියෙන ලොකු අඩුපාඩුවක්. ඇත්තටම මෙහි ඉන්න නිලධාරීන් සම්බන්ධයෙනුත් ඇත්තටම ලොකු ප්‍රශ්නයක් කාටද මේ වැඩකරන්නේ, කාටද රිපෝට් කරන්නේ කියලා. එතනින් එහාට කථාකරන්න පුළුවන් වත්කම් ප්‍රතිගහනය වත්කම් ක්ෂයවීම සම්බන්ධයෙන් ගිණුම්ගත නොකිරීම. එතකොට මිලියන 82ක් තරම් වත්කම් ලේඛනගත නොකිරීම. එතකොට හඳුනා නොගත් බැර ශේෂ 74 ක වටිනාකම් හඳුන්වලා දීලා තියෙනවා.

නොසැසඳුනු පාලන ගිණුම් සහ වාර්තා විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම. එතකොට ලිඛිත සාක්ෂි නොවීම සෙක්ෂන් එක යටතේ කථා කළොත් ව්‍යාපාර බදු සඳහා මිලියන 53ක් අත්තිකාරම් ගිණුම් පොදු ගබඩා තොග සඳහා මිලියන 21ක් එතකොට ව්‍යාපාර බදු සඳහා ලිඛිත සාක්ෂි නැතිව මිලියන 53ක් විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේෂණය ඇයි මේ මෙහෙම වෙන්නේ. මොකක්ද මෙහි තේරුම. කවුද මෙයට වගකියන්නේ. මිලියන 53ක් ව්‍යාපාර බදු සඳහා සාක්ෂි නැහැ. එතකොට මෙය කපා හැරලාද? මේ සම්බන්ධයෙන් එකින් එක ෆිල්ටර් කරලා එකින් එකට හේතු හොයලා තියෙනවාද? නැත්නම් මේ ගණන් කොහොමද එන්නේ. මෙතනින් එහාට ගිහිල්ලා නගරාධිපතිතුමනි, මෙතන කියනවා වරිපනම් බදු රැස්කල ආදායම මිලියන 209කින් 108යි දෙසැම්බර් 31 වනදා දක්වා සම්පූර්ණ වත්කම් මිලියන 310ක් මෙතන අපි යම් ප්‍රමාණයක් කපා හැරලා තියෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් අතිවිශාල ගාණක් අපේ ආදායම ලැබෙන්නේ වරිපනම් බදුවලින් නම් අපි ඒ බදු එකතු කර ගැනීමට අපේ කාර්යය පටිපාටිය නිශ්චිතව සිද්ධවෙන්නේ නැත්නම් කවුද මේ සම්බන්ධයෙන් වගකීම ගන්නේ. එය තමයි අපිට තියෙන පැහැදිලිම ප්‍රශ්නය වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම හිඟ වරිපනම් බදු ශේෂය මිලියන 257යි පනස්දහස ඉක්මවූ වරිපනම් ඒකක 361කින් අයවිය යුතු මිලියන 91ක් මම ඉස්සෙල්ලා කිවුවා වගේ ඔක්කොම එකතු කළොත් මිලියන 500 නොවෙයි මිලියන 1000 දක්වා යනවා. කාගේ සල්ලිද අපි කවුරුත් ගෙදරින් ගෙනාපු සල්ලි නෙමෙයි. මහජනතාවගේ සල්ලි එතනින් එහාට ගිහිල්ලා වරිපනම් බදු ශේෂ

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කියන කථාව පිළිබඳව මම බොහොම සැලකිලිමත් වෙනවා. හේතුව දැන් ඔබතුමිය කියනවානේ වරිපනම් බදු අයකිරීම කරන්නේ නැහැ කියලා. හිඟ කියන්නේ කරලා නැහැනේ. මීට එහා පැත්තේ ඉන්න සිත්ති මසිනා බක්කර් මන්ත්‍රීතුමිය මෙය ඔය විදියට නෙමෙයි ඇහුවේ. ඔබතුමිය එය කියනවා දැන් ඔබතුමියම කියන්න ලංකාවේම ඔබතුමිය කියන්නේ වරිපනම් බදු ගන්න උස්සහා කරන්නේ නැති ආයතනයක් කියලානේ. අපි ගන්නේ නැහැ. ඔබතුමිය දන්නවාද ලංකාවේම වරිපනම් බදු ගෙවන මිනිස්සුන්ගේ බදු ගෙවාගන්න ඕනෑ නිසා වට්ටම් දෙන්නේ ඒ අදාල වර්ෂයට විතරයි. මේ සභාව විතරයි ඒකට නිත්‍යානුකූල පසුබිමක් හදාගෙන අවුරුදු 10 - 15 එකතු වෙච්ච ඒවාටත් වට්ටම දෙන්නේ සියයට 10. ඒක දෙන්නේ ඩිම්

ගෙන් කපලා වරිපනම් බදු අයකර ගැනීම සඳහා කලින්. කලින් ඉස්සෙල්ලාම සල්ලි දුන්නේ මගේ අතින් ලක්ෂයක් දෙනවා ගිහිල්ලා වට්ටම දීලා එන්න ඩීඕගෙන් මම දවස් දෙකකට පස්සේ සල්ලි ගන්නවා. කවුරුහරි කිවුවොත් මෙන්න මේ ආයතනය කරනවා කියලා සිකුරාදා මම ඉල්ලා අස්වීමේ ලිපිය දෙනවා. වරිපනම් බදු අයකරන්න සභාවල් විසින් යෝජනා නොකරපු දේවල් යෝජනා කරලා තියෙනවා. ඒවිතරක් නෙමෙයි අහිංසක මනුස්සයෙක් නගර සභා ගෙයක ඉන්න කොට වරිපනම් ගෙවලා නැත්නම් ළමයා ඉස්කෝලෙට දාන්න ඉදිරි කාලයේදි ඔප්පුව ලබා දෙනවා. මෙහි ඔහු පදිංචිවෙලා ඉන්නවා කියලා වරිපනම් බදු ගෙවන්න තියෙනවා රුපියල් හත්අටදාහක් විසිදාහක් එක ගෙවනකම් දුන්නේ නැහැ. අන්න ඒ කටයුත්ත වරිපනම් නොගෙවන ඒවා ලංකාවේ හැමතැනම ඇති ඔබතුමිය ඉන්නේ මේ ආයතනයේ විතරක් නිසා හැබැයි ඔබතුමියට හරි වටිනාකමක් තියෙන ආයතනයක් වෙලා තියෙනවා මේ නගර සභාව. මේ වරිපනම් බදු ගෙවන්න කිසිම නගර සභාවක් කරන්නෙ නැති දෙයක් අපි කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා සත්භාවයෙන් කරන උත්සාහය ගැන අපි ප්‍රශංශා කරනවා. නමුත් එය කළා කියලා ඒ ප්‍රශ්නවලට විසඳුමකුත් නෙමෙයි.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, එකතු කිරිමට උත්සහ ගන්නේ නැහැ කියන්න එපා. මේ වගේ දේවල් කරමින් උස්සාහ ගන්නවා. ඩීඕට තියෙන රු. 15 රු. 12ට බස්සලා තුනක් ඩීඕට දිලා 12ක් දෙනවා වරිපනම් අයකරන්න. 12 දෙකට බස්සලා 6 ක් දෙනවා ඔවුන්ට මේ දෙන්න පුළුවන් වර්ෂයක් විතරයි අපි දෙනවා වර්ෂ 10 - 15 ඒවටත්

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් වරිපනම් බදු ගෙවන්නේ නැත්නම් ඒ හරහා නගර සභාවෙන් ලැබිය යුතු සේවාව කපා හරින්නත් පුළුවන්නේ. ඒත් එහෙම ක්‍රමවේදයක් නැහැනේ මේ රටේ.

**සභා ඝෝෂා**

ගරු නගරාධිපතිතුමනි, අද රටේ ප්‍රශ්නය මෙයයි, රජය වියදම් දරනවා බදු ගෙවන මිනිස්සුගෙවනවා නොගෙවන මිනිස්සු ගෙවන්නේම නැහැ, අද රටේ ප්‍රශ්න ඇති වෙන්නේ මේ වගේ ආයතන වලින් පොඩි පොඩි ප්‍රශ්න එකතු වුනාම. අපි වගේ ආයතනයක බිලියන එකයි දශම තුනක රේවනිව් එකක් තියෙන ආයතනයකින් මිලියන 257ක් අපේ ලැබෙන්න ඕනෑ ආදායම එකතු කරගන්නේ නැත්නම් කාටද මෙය කියන්නේ. නිලධාරින්ගේ වගකීමද, ඔබතුමාගේ වගකීමද අවසානයේදී මෙයට බැදෙන්නේ. මේ සාධාරණ ප්‍රශ්න මෙයට උත්තර හොයන්නෙත් නැහැ ගිය අවුරුද්දේත් මෙයට ඔඩිට් රිපෝට් එකෙත් මේ විදිහටම තිබුණා දැන් මේ අවුරුද්දේත් තියෙනවා මේවා දිගින් දිගටම තියෙයි, මේ ප්‍රශ්න වලට විසඳුමක් නැහැ තර්ක කිරීම් විතරයි, එතනින් එහාට ගිහිල්ලා සභාව සතු බදු දේපල 250කින් 32ක් සඳහා ගිවිසුම් අත්සන් නොකරමින්. එතනින් එහාට ගිහිල්ලා මුරපදයේ කතාව, ඒක ඇත්තටම ලොකු අක්‍රමිකතාවයක් එය ඇත්තටම සිදුනොවිය යුත්තක්. එය සිස්ටම් එකකට ලොග්වෙලා එකවුන්ට්ස් මාරු කරන්න පුළුවන්නම් එය ඇත්තටම ආයතනය පරිපාලන අතින් තියෙන ලොකු ගැටළුවක්, ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මානව සම්පත් කළමනාකරණ අංශයට ගියොත් එතන අපි නිතරම ආයතන කමිටුව විසින් කතා කරන වැටුප් ප්‍රතිපූර්ණය නොකිරීම සම්බන්ධයෙන් හා මෙහි තියෙනවා සේවකයින් 83ක් සඳහා සමස්ථ වර්ෂය තුළදී වැටුප් හා දීමනා මිලියන 23 දක්වා ප්‍රතිපූර්ණය නොකිරීම ගැන, තවද ස්ථිර පත්වීම් ලබාදුන් සේවකයින් 112ගේ 2021 දෙසැම්බර් 31 වන දිනවත් සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවීම ඉතින් මේ වගේ හැම අංශයකම කළමනාකරණ පරිපාලන දුර්වලතා අක්‍රමිකතා හා වංචා දූෂණ වැරදි තමයි විපක්ෂයක් හැටියට අපිට තියෙන ගැටළුව, අපි මේ සම්බන්ධයෙන් කතා කළාට වැඩක් නැහැ. මේ දේවල් නිවැරදි කරන්න ක්‍රියාමාර්ග ගන්නේ නැත්නම්. අපි මේ නගර සභාවේ අවුරුදු 04ක් ඉදලත් මෙය වෙන්නේ නැත්තම් වැඩක් නැහැ, හොදම උදාහරණය තමයි නොගෙවපු වරිපනම් බදු මුදල 2020 මිලියන 210 වෙනකොට 2021 මිලියන 310 වෙනවා මිලියන 100කින් ඒක වැඩි වෙනවා මින් පෙනී යන්නේ ආයතනයක් හැටියට අපේ දුර්වලතා. ඉතින් මෙය නිවැරදි කරගෙන ඉස්සරහට යනවද, රජයේ පාඩුවලට අපිත් හවුල් වෙනවද කියලා තමයි අපි හිතන්න ඕනෑ. අපි

දේශපාලන අධිකාරිය, රාජ්‍ය නිලධාරින් තියෙනවා වගකීමක් මේ සම්බන්ධයෙන් වෙන්නේ නැත්තම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න එක වුනාද නැද්ද කියන එක ප්‍රශ්නාර්ථයක්, මෙයට වගවීමට දෙපැත්තම බැදෙනවා, රාජ්‍ය නිලධාරින් වැඩියෙන් බැදෙනවා අද රටේ තියෙන ප්‍රශ්න සම්බන්ධයෙන් කියමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, මම ඇත්තටම පුනපුනා බලා හිටියා නීතිඥවරියෙක් විදිහටත් නොතාරිස් වැඩෙත් කරන නිසා එතුමියගෙන් මේ සභාවට ලැබෙන්න ඕනැ ආදායම විගණනය කරන්නෙත් නැහැ විගණනයට ලක් වෙන්නෙත් නැහැ ඒ සම්බන්ධයෙන් උදවුවක් දෙන්නෙත් නැහැ ඔබතුමිය හොඳාකාරවම දන්නවා මේ රටේ ප්‍රඥප්ති පනවා ගන්නවා මූලික නීතිය උල්ලංඝණය කරමින්. මේ වෙනකොට රමේෂ්ද සිල්වා මැතිතුමාට මේ නඩු භාර දීලා ලක්ෂ 46 ක් 47 ක් යනවා මේ නඩුවට මූලික මුදල ගෙවන්න ඒ මුදල ගෙවුවාට පස්සේ කාලාවරෝධය කියන එක අහෝසි වෙනවා එතකොට මේ පනතේ තියෙනවා. 210 වෙනි පිටුවේ තියෙනවා 3 (අ) මහා නගර සභාවේ පාලන සීමාව තුළ පිහිටි ඉඩමකට ආදාලව කරන ලද පැවරීම්, උකස් කිරීම්, බැදුම්කර හා තෑගි කිරීම්, බදුකර වෙනුවෙන් මුද්දර කටයුතු පනත යටතේ ගෙවන ලද සියළුම මුද්දර ගාස්තු, උදාහරණයකට මම බැංකුවෙන් ලෝන් එකක් ගත්තා ලක්ෂ 50ක ඡන්දය වේලාවෙ. එතකොට මේ ගත්ත එකට සත පහක මුද්දර ආදායමක් එන්නේ නැහැ නගර සභාවට මොන විගණනයද මෙය විගණනය කරන්නේ, බැංකුවල උකස්කර, බැදුම්කර, බදුකර තියෙනවානේ, උදාහරණයක් ලෙස ඔබතුමියගේ ගොඩනැගිල්ලක් මම ගන්නවා බදුකරයක් ලෙස.

**සභා ඝෝෂා**

එහෙම රටේ නීතියක් නැහැ මෙය එක එක ආයතන හදාගත්ත එකක්.මෙහි තියෙන්නේ පැහැදිලිව.මෙහි නීති එහෙම එක එක්කෙනාට නවන්න,කඩන්න බැහැ. නවන්න කඩන්න පුළුවන් විගණනය කරන්නත් බැනේ මාව,මේ ආයතනය විගණනය කරන්නත් බැහැනේ,මින් එහා මොනවා හරි තියෙනවානම්, මෙහි තියෙනවා මහා නගර සභාවේ පාළන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් පවරන ලද පැවරීම්, උකස්, බැදුම්කර,තෑගි කිරීම්,බදුකර වෙනුවෙන් මුද්දර ගාස්තු.ඒවා අපිට එන්නේ නැහැ,ඒ නිසා තමයි මම එයට නඩුවක් පවත්වාගෙන යන්නේ,අනික කාලාවරෝධය,උදාහරණයකට ඔබතුමියගේ ඔප්පුවක් ලියනවා ඔබතුමිය මෙය විගණනය වෙන්නේ නැහැ,විගණනය වෙන්නේ පිහන් හෝදන මිනිහගෙන් පිහන් කැඩුනම ඇයි කැඩුනේ, පිහන් 100ක් හෝදන්න පුළුවන් සබන් කැටයක් ඇයි පිහන් 25න් දිය වුනේ ඒවා තමයි විගණනය වෙන්නේ, හැබැයි අපේ විගණනය වෙමින් අපිට ලැබෙන්න ඕනැ ආදායම ගැන අපිට දෙන්නේ නැහැ, මුද්දර ආදායම අපිට ලක්ෂ 500ක් 600ක් අතර ප්‍රමාණයක් ඒ, ඔබතුමිය දන්නේ නැතුව ඇති ඔබතුමියට පෙර කාලේ ඉදලා අපි කතා කරලා මෙහි අධිකරණ බල සීමාවල් තියෙනවානේ උදාහරණයකට රාහුල මාවතෙන් එහාට, සොයිසා ෆ්ලැට් එකෙන් එහාට අධිකරණ බලය යන්නේ ගල්කිස්සට එය කියලා කියලා මම ඔක්කෝම ගත්තා මෙහෙට දැන් අපිට හම්බෙනවා. ඉස්සර අපේ මනුස්සයෙක් කල්දමුල්ලේ, සොයිසාපුර, තෙලවල, බොරුපන වෙළඳ බලපත්‍රයක් ගෙවුවේ නැතිවුණාම උසාවි දානවා, උසාවි දාන්න අධිකරණ බලය එන්නේ ගල්කිස්සට. දඩය යනවා ගල්කිස්සට, ලක්ෂ 1500ක් 2000ක් විතර ගිහිල්ලා තියෙන්නේ සල්ලි දෙන්නේ නැහැ. ගණනය කරන්නේ නැහැ, අධිකරණ බලය තියෙන්නේ ගල්කිස්සට නිසා. යාන්තම් කියලා කියලා එක හරිගස්ස ගත්තා දැන් ඔක්කෝම ටික අපිට එනවා. ඒ වගේම මෙයත් එහෙම එකක්, මොන ඔඩිට්ද මෙය ඔඩිට් කළේ මෙහි වෙලා තියෙන්නේ, අද නිලධාරින් විසින් මහජන නියෝජිතයාව අපහසුතාවයට පත්වෙන යම් යම් කාරණා රාශියක් වෙමින් පවතින කාලසීමාවක් තමයි මේ තියෙන්නේ

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ඇත්තටම ඔබතුමාගේ දැනගැනීම පිණිස කියන්නේ, මුද්දර ගාස්තු ගෙවනකොට බැංකුවෙන් ස්ලිප් දෙකක් තියෙනවා. එකක් ලිස් මෝගේජස් වලට, එකක් තෑගි ඔප්පු හා පැවරුම්කර වලට. එහි උඩින් පැහැදිලිවම සඳහන් වෙනවා එය පළාත් පාලන ආයතන වලට යන්නේ කියලා සෙන්ට්‍රල් ගවන්මන්ට් එකට ලීස් ඇන්ඩ් මෝගේජස් යනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, මේ රුපියල දෙනවාද කියලා ඇහුවා, රුපියලක් ගන්නවට කැමතිද ඇහුවා හැම එකකින්ම, මේ ඔක්කෝම වෙන්නේ අපිට, නැත්තම් මේ පනතෙන් මේ ඔක්කොම ඉවත් කරන්න ඕනෑ. මෙය සංශෝධිත පනතක්, මේ පනත සංශෝධනය වුණේ 2018 පළාත් පාලන මැතිවරණයත් එක්ක, මෙහි මැතිවරණ ක්‍රමය විතරක් නෙවෙයි වෙනස් වුනේ, තව යම් යම් දේවල් සංශෝධනය වුණා. එහෙනම් මෙය තියන්න ඕනෑ නැහැනේ අයින් කරන්න තිබුණනේ. 210 වෙනි පිටුවේ 3 (අ) ඔබතුමිය පොත අල්ලනකොට ඔබතුමියගේ වම් පැත්තේ තියෙන්නේ ඒක.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඞී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මෙම විශේෂ සභාව ලබාදීම පිළිබඳ පළමුව ස්තුතිවන්ත වෙනවා. නමුත්, මෙම විශේෂ සභාවේ අපි කවුරුත් මන්ත්‍රීවරු තමන්ගේ තිබෙන වැඩ රාජකාරී පසෙක දාලා මේ ස්ථානයට අද එකතුවෙලා, විශේෂයෙන් නිලධාරීන් ඔවුන්ට මේ ආයතනයේ තියෙන වැඩ රාජකාරී පසෙකට දාලා යම් වැයක් දරලා තමයි මේ විශේෂ සභාව පවත්වන්නේ, එක පැත්තකින් වැයක් දරණවා වගේම, එක පැත්තකින් මේ ආයතනයට වැදගත් වෙච්ච සාකච්ඡාවක් කරගන්න ඒක තමයි අපි කාගෙත් වගකීම, අපි කවුරුත් මේ ආයතනයේ මූලා‍ය වගකීම දරණ මහජන නියෝජිතයෝ, මේ ආයතනයේ දේපළ වත්කම් වලට වගකියන මහජන නියෝජිතයෝ ඒ නිසා අපි කාටත් වගකීමක් තියෙනවා. මේ විගණකාධිපතිවරයාගේ වාර්ථාව පිළිබඳව යම් සාකච්ඡාවක් කරලා එහි තියෙන අඩුපාඩුකම් වෙනස්කම් හෙට දවසේ මේ ආයතනයට වඩාත් ඵලදායි වන ලෙස යමක් කරගැනීම වෙනුවෙන් අපේ මැදිහත්වීම අපේ සාකච්ඡාව කරගන්නවා නැතුව මේ සාකච්ඡාව තිබෙන්නේ තම තමන්ගේ දේශපාලන අරමුණු මුදුන්පත් කරගන්න නම්, මම තමයි හරි මම තමයි පොර. මෙවැනි ආකල්පයකින් කටයුතු කළොත් මම හිතන්නේ මෙය සාධාරණ වෙන්නේ නැහැ. ඒ නිසා විශේෂ සභාවක් ඉල්ලා මේ යෝජනාව එනකොටම මට දෙගිඩියාවක් තිබුණා. වැඩක් වෙයිදෝ කියලා. නමුත්, අත්සන් කළා අත්සන් කරන්න කිවුවා, මොකද අපි එකඟ නිසා මේ සාකච්ඡාවට. පළමුවෙන්ම කියන්න ඕනෑ දැන් විගණකාධිපතිවරයා එවන ලද වාර්ථාව මේ සාකච්ඡාවට ගැනෙන්නේ ඒකට දැන් ඔබේ උත්තර ඕනෑ නැහැ මොකද උත්තර දීපු වාර්ථාවකුත් තියෙනවා. ඒනිසා අමුතුවෙන් උත්තර අවශ්‍ය නැහැ. අපේ අතේ දැන් තියෙනවා විගණකාධිපතිවරයා මාස දින වාකවානු දාපු විගණන වාර්ථා දෙකක් එකක්. ජුලි මාසේ එකක් අගෝස්තු මාසේ ජුලි මාසෙත් එවනවා නගරාධිපතිවරයා ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ට, අගෝස්තු මාසේ 19ත් එවනවා නගරාධිපතිවරයා ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ට. දැන් මම දන්න විදිහට විගණකාධිපති එහෙම වාර්ථා දෙකක් එවන්නේ නැහැ. ඒනිසා මට කාරුණාකරලා කියන්න දින වාකවානු සහිතව නගරාධිපති ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ට විගණන වාර්ථා දෙකක් එවුවද? එක වාර්ථාවද එවුවේ?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, වාර්ථා දෙකක් එවුවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඞී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ජුලි 26 එකයි අගෝස්තු 19 එකයි. ජුලි 26 ඒකේ රාජ්‍ය සීල් එක පහළට ගහන්නත් අගෝස්තු 19 එකේ රාජ්‍ය සීල් එක පහළට නොගහන්නත් ඒ අයගේ අතපසු වීමක්ද?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඒක ඒගොල්ලන්ගෙන් තමයි අහන්න ඕනෑ, අපි ළඟ රාජ්‍ය සීල් එකක් නැහැනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඞී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එකම වාර්ථාව එකම කරුණු ආකෘතියේ වෙනසක් කරලා එවන්න බලපාන හේතුව කාරුණාකරලා විගණනාධිපතිවරයාගෙන් අහන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එය විගණනය වෙන්නේ කොහෙන්ද කියලා මට තේරෙන්නේ නැහැ, කොළ නාස්ති කරලා මෙහෙම එවන්නේ ඇයි කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමා, මම කියන්නේ ජුලි 26 එවපු වාර්ථාව අපිට අගෝස්තු නෙවෙයි සැප්තැම්බර් මාසේ පිළිතුරු දෙන වාර්ථාවත් එක්ක තමයි ඔබ එවන්නේ ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මෙය වරදක් ජුලි 26 ඔබට සහ සභිකවරුන්ට එවන වාර්ථාව පිළිතුරු සපයන සභාවේ අදහස් දක්වන එකත් එක්ක එනවා සැප්තැම්බර් මාසේ මහා සභා මුදල් කමිටුවක්. ඒනිසා එතනින්ම පැහැදිලි ජුලි මාසේ 26 එවපු වාර්ථාව මන්ත්‍රීවරුන්ගේ අතට පත්කරන්නේ සැප්තැම්බර් මාසේ මම කොමසාරිස්වරයාගෙන් ඇහුවට පස්සේ, අහනකොටත් කොමසාරිස්වරයා කියන්නේ දුන්නේ නැද්ද, දුන්නා වාගේ මතකයි, මම බලලා කියන්නම්, අද වෙනකන් කිව්වෙත් නැහැ. ඒනිසා පළමු කාරණය තමයි මෙය මෙහෙම නෙවෙයි යන්න ඕනෑ. මම හිතන විදිහට මෙහෙම වාර්ථා දෙකක් එවන්න හේතුවක් නැහැ. ගරු නගරාධිපතිතුමනි, අපි මෙය ඉතා කෙටියෙන් ඉවර කරනවා මොකද අපිකාටත් වැදගත් වෙලාවක් ප්‍රතිඵලදායක නැත්තම් සාකච්ඡා වැඩක් නැහැ, ප්‍රතිඵලදායක වෙන්නේ කාගේවත් සුදුහුණු ගාගන්න එක නෙවෙයි, කාටවත් චෝදනා කරන එක නෙවෙයි. ඔහු කියන කරුණු කාරණාවල අඩංගුව පිළිබඳ වැදගත් වෙන්නේ ඒනිසා මේ රාජ්‍ය ආයතනයක් විගණනයට ලක්වීම අපේ රටේ නීතියක් ඒ විගණනයේදී අපේ ආදායම් වත්කම් වියදම් සම්බන්ධයෙන් තමයි වැඩිපුර ඔවුන් කතා කරන්නේ ඒකෙන් කියන්නේ අපේ පසුගිය අවුරුද්ද පිළිබඳ හැරිලා බලන්න. ඒ බලලා අඩුපාඩු, දූර්වලතා, අකාර්යක්ෂමතා, නාස්ති, වංචා දූෂණ මෙන්ම සිදුවන අක්‍රමිකතා අවම කරගැනීම සඳහා ලේඛනයේ පෙන්වා දෙන දේවල් බරකින් සැලකිල්ලට ලක්කරනවා නම් විතරයි මෙය වැදගත් වෙන්නේ. ඒ වගේම අපි දන්නවා මේ ලේඛනය ඒ අභ්‍යන්තර කරුණු කතා කරන්න පෙර සකස් කිරීම හා ප්‍රධාන කාරණා 3ක්, එකක් විගණකාධිපති නියෝජනය කරන මොරටුව මහා නගර සභාවේ විගණන අංශය ඒ අයට තියෙන හැකියාව, ඒ අයගේ සම්පත්, ඒ මානව සම්පත් වෙන්න පුළුවන් ඒවාගේ සාර්ථක වාර්ථාවල් සකස් කර ගැනීම සඳහා ඔවුන් දරණ උත්සහය ලේඛන මත පදනම් වෙලා තමයි ඔවුන්ගේ මේ ලියවිල්ල එන්නේ. ඒනිසා ඒ ලියවිල්ල ඔවුන්ට ඉතා නිවැරදි සාර්ථක ලේඛනයක් මේ සභාවට ඉදිරිපත් කරන්නනම් මේ සභාව ඔවුන්ට උදව් කළයුතුයි. ඔවුන් ඉල්ලන ලිපි ලේඛන, දත්ත, තොරතුරු ලබාදිය යුතුයි. ඒ සුසංයෝගය පවත්වා ගත්තොත් ඉතාම නිවැරදි එකක් එනවා නැත්නම් වඩාත්ම නිවැරදි එකක් එන්නේ නැහැ. මේ ආපු එක සැලකිල්ලට ගැනීමේදී එය සහ මන්ත්‍රීවරයෙක් හැටියට මට තියෙන වගකීම ඇතුව මම ලබා ගත්ත දේත් එක්ක මට විශාල පරස්පරයක් තියෙනවා. මම දන්න කරන දේවල් මම අත්විඳින දේවල් මේ සභාව පිළිබඳ මට තියෙන දැනුම, අවබෝධය සහ මේ ලේඛනය අතර තියෙන ඒවා වලින් මට ලොකු පරස්පරයක් තියෙනවා. මගේ එක ආදාල නැහැ. මගේ එක තිබ්බා පැත්තකින්, මේ ලේඛනය තමයි දැන් වැදගත්. මේ ලේඛනය සකස් කිරීමේදි මොරටුවේ නගරාධිපතිවරයා සහ කොමසාරිස්වරයා තමයි ප්‍රමුඛ. ඒනිසා ඔබ වඩවඩාත් මේ ආයතනය ගැන හිතමින්, මූල්‍ය පාලනය පිළබඳ අවංකවනම් කටයුතු කරන්නේ මෙය වැදගත්. නමුත් දැන් අපිට පැහැදිලි වෙනවා වාද විවාදමය උත්තර ඇතුලේ තියෙන්නේ ඒ අවංකකම නෙවෙයි. හැබැයි මේ වාර්ථාව කියවන්න ගරු නගරාධිපතිතුමා, මේ වාර්ථාව පටන්ගන්න තුන්වන පිටුවේ 1 (4) 1 (ආ) එහි වරද පිළිගන්නවා. සියලු ස්ථාවර වත්කම් චක්‍රලේඛන උපදෙස් ප්‍රකාරව ප්‍රත්‍යගණනය කළ යුතුයි. එක හේතුවක් කියනවා සාධාරණ කොවිඩ්. ඊළඟට (ආ) එහි වරද පිළිගන්නවා පද්ධතිය හඳුන්වා දියයුතුයි චක්‍රලේඛන උපදෙස් ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුයි. වරද පිළිගන්නවා ඔවුන් කියන අඩුව පිළිගන්නවා, එය නිවැරදි කරන්න එකඟ වෙනවා. සමහර කාරණා (ඇ) එහි කියනවා 2019 දෙසැම්බර් 31 දිනෙන් පවතින දේපල සම්බන්ධයෙන් පද්ධතිය හඳුන්වා දියයුතුයි. වරදක් තියෙනවා වර්ෂයේ වත්කම් ප්‍රත්‍යගණනය කළ නොහැකි වූ බැවින්, ප්‍රත්‍යගණනයේ සංචිත ගිණුමක් ඇතිකර ගැනීමට නොහැකි වූ බව දන්වා සිටින අතර ඉදිරියේදි, ඉදිරියේදී කරනවා වරදක් වුණා කියලා පිළිගන්නවා. අමතර උත්තර අවශ්‍ය නැහැ මේ ලේඛනයෙන් වරද පිළිගෙන තියෙනවා සමහර ඒවට උත්තර දක්වලා තියෙනවා. ඒ හේතු සමහරක් පිළිගන්න පුළුවන් සමහරක් ඒවා බැහැ. මීළඟට (ඊ) වසර සඳහා වූ අතිරික්ත මේ සියල්ල ගැලපි ඇති බැවින්, අන්න ඒ හේතුව අපිට පිළිගන්න වෙනවා. මෙතන (ඊ) එකේ කියනවා පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති තුන අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල

කිරීමේදී වාර්ෂික ස්ථාවර තැන්පත් පොළී ආදිය ගැලපුම් කර නොමැති බැවින් වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම අඩුවීම වන බව නිරීක්ෂණය විය. වර්ෂ අවසානයේ මේ සියල්ල ගැලපිලා, මෙය නිවැරදිව ලේඛනගත කරලා ඔවුන්ට ලබා දීමට නොහැකිවීමේ අඩුව පිළිගන්නවා, සමහර ඒවා මධ්‍යම වෙළඳපොල ඔබේ අවධානය යොමු කරනවා 6 වෙනි පිටුව මධ්‍යම වෙළඳපොලේ කඩ කුළී ශේෂයන් හා පොදු වෙළඳපොල කඩකුළී ශේෂයන් පිළිබඳ විගණනය කියන ඉදිරිපත් කරන කාරණාවට සභාවේ අදහස් නැහැ, ඔබ විශාල කතාවක් මෙතන කිව්වා. සභාවේ අදහස් දක්වා නොමැත, ගණුදෙනුව නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. මම මේ කියන්නේ ඔබ උත්තර දීපු ලේඛනය ගැන, මේ වාර්ථාවේ 7වෙනි පිටුවේ මුදල් රෙගුලාසි හානි වූ පාඩු වූ දේ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් අළුත්වැඩියාවන් සිදුකර ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්ථා කළ නොතිබුනි. පිළිගන්නවා, රථ වාහන සඳහා රක්ෂණාවරන සපයන ලද සමුපාකාර රක්ෂණ සමාගම විසින් ඇතැම් වාහන වල රක්ෂණ ප්‍රතිපූර්ණය කිරීම ප්‍රමාද වූ බැවින් අළුත්වැඩියාව සිදුකර ගැනීම සඳහා ආදාල අලුත්වැඩියාවන් ප්‍රතිපූර්ණකර ගැනීමෙන් පසු විගණකාධිපති වෙත දන්වනවා කියලා කියනවා. ඒ කියන්නේ පිළිගන්නවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, නැහැ අපි පිළිගෙන නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පිළිගන්නේ නැත්නම් මොකද්ද මේ කියන්නේ? අදාල අළුත්වැඩියාවන් සිදුකර ප්‍රතිපූර්ණ කටයුතු සිදුකර ගැනීමේ, අගෝස්තු මාසේ 7 වෙනි පිටුවේ මුදල් රේගුලාසි 104 (2) හානි හා පාඩු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්ථා කලයුතු වුවත් සමාලෝචිත

වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරු 05ක් සම්බන්ධයෙන් අළුත්වැඩියාවන් සිදුකර ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්ථා කර නොතිබුණි කියලා විගණක කියනවා. එතකොට සභාවේ අදහස් දැක්වීම, රථවාහන සඳහා රක්ෂණාවරන සපයන ලද සමුපාකාර රක්ෂණ සමාගම විසින් ඇතැම් වාහන වල රක්ෂණ ප්‍රතිපූර්ණය කිරීම ප්‍රමාද වූ බැවින් අළුත්වැඩියාව සිදුකර ගැනීම සඳහා නොහැකි වී ඇත කියලා කියනවා, ඊළඟට කියනවා අදාල අළුත්වැඩියාවන් සිදුකර ප්‍රතිපූර්ණ කටයුතු සිදුකර ගැනීමෙන් පසු විගණකාධිපති වෙත දන්වා යවන බව කාරුණිකව දන්වා සිටිමි. මම කියන්නේ වරද පිළිගත්තා හේතුව කිව්වා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, වරද පිළිගෙන නෙවෙයි හේතු කිව්වේ. මේ රටේ සිස්ටම් එකක් තියෙනවා දැන් අපේ වාහනයක් හැප්පුන ගමන්ම රක්ෂණ සමාගමෙන් කැමති නැහැ අපි කියන ගාන දෙන්න. ඔවුන් පරීක්ෂණ පවත්වනවා පවත්වලා ඔවුන් කියනවා මෙන්න මෙයයි මුදල කියලා. කොටේෂන් ගෙන්න කියනවා අපි ඊට පස්සේ අපි හදලා යවනවා. ඔබතුමා කියන එක හරි, මේ උත්තරත් යවලා තියෙන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ගොඩක් කාලය ගන්න එපා අපරාදෙනේ. මම කියන්නේ සමන්ලාල් නගරාධිපතිවරයාගේ පාලනය ඇතුලේ මේ, 2021 ඉදිරිපත් කරන විගණන වාර්ථාවේ විගණකගේ කරුණු බොහොමයක් පිළිගනිමින් ඔහු පෙන්වා දෙන අඩුපාඩුකම් වැරදි පිළිගනිමින් ඒවා නිවැරදි කරන බවට මෙහි උත්තර සඳහන් වෙනවා. ඒනිසා ඔබේ ප්‍රකාශ දැන් අපිට අදාල වන්නේ නැහැ, අපි සංවාද කරන්නේ ඔබ අපිට එවලා තියෙන 2021 විගණන වාර්ථාව ගැන. ප්‍රශ්නයක් තිබුණනම් එය අහන්න ඕනෑ. විගණකාධිපති වාර්ථා දෙකක් එවුවද මොකද දින වාකවානු සහිතව දෙකක් තියෙනවා ඔබ ඒ උත්තර දීපුවා. ඒනිසා මම කියන්නේ සමහර ඒවට උත්තර නැහැ ඔබේ අවධානය යොමු කරන්නකෝ පිටු අංක 8 මුදල් රේගුලාසි 156 - 2003, 2015 වර්ෂය සඳහා සේවා නියුක්තිකයින් භාර අරමුදල අපි දීර්ඝ කාලයක් මෙයට අදාල ගෙවීම් කරමින් ඉන්නවා කියලා අපිට අවබෝධයක් තියෙනවනේ. දැන් මෙහි සභාවේ අදහස් දක්වා නොමැත. මීට ආදාලව පළාත්

පාලන කොමසාරිස් කාර්යයාලය විසින් පරික්ෂණයක්, ඒ කියන්නේ අර එක්කෝටි ගානේ වන්දිය, කිසියම් පාර්ෂවයක් පර්යේෂණය කරලා අවසන් වෙනකන් අපි බලන් ඉන්නවා.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඉතින් මොකද්ද අපිට කරන්න කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එක තමයි අපි කියන්නේ අපි මෙහි සංවාදයක් විසංවාදයක් ඇති කර ගතයුතු නැහැකලයුතු දේවල් මොනවද කියලනේ බලන්න ඕනෑ.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කියනවා මගේ කතාව වැඩක් නැහැ කියලා මෙහි තියෙන දේවල් බල බල ඔබතුමා කියනවා, විගණනයට උත්තර යවලා ඉවරයි මේ සඳහා, අපිට ඉහළින් ආදාල වන්නාවූ ආයතනයකට මෙය භාරදීලා තියෙන්නේ පර්යේෂණ කරන්න, පර්යේෂණ කරන්න දීලා තියෙද්දි නැවත නැවත අහලා එවනවානම් මොකද්ද කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එකක් දෙකක් නෙමෙයි ඔබේ පාලන කාලයේ දීර්ඝ කාලයක් තිස්සේ එන ඒවා ගණනාවක් තියෙනවානේ.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අධිභාරයකට ලක්වෙලා තියෙනවානම් ඒ එකම දෙයයි ඒ ඔබත් මමත් ඉන්න අධිභාරයක් විතරයි. ඔබත් මමත් ගත්ත මුදලකට තියෙන අධිභාරයක් විතරයි. වෙන අධිභාර නැහැ මුකුත්, ඒකෙන් නිලධාරින්ව අයින්කරලා ඔබවත් මාවත් අයින්කරලා නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කාටවත් චෝදනා කරමින් ඒවා නිවැරදි කරගන්න යන්න එපා.

**සභා ඝෝෂා**

සංවාද කළ යුත්තේ ප්‍රතිපලයක් බලාගෙන මිස මේ වගේ හිස් වචන කැගහන්න නෙවෙයි. දැන් මේ පිටුව 18 මට කියන්නකෝ, වාහන ධාවනය සඳහා ආදායම් බලපත්‍ර, රක්ෂණ සහතික ලබා ගත යුතු වුවද සභාව සතු වාහන 19ක් සඳහා ආදායම් බලපත්‍ර වාහන 13ක් සඳහා රක්ෂණ සහතිකද ලබාගෙන නොතිබුණි කියලා විගණක කියනවා. සභාව අදහස් දක්වනවා ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති වාහන 22ක් ලෙස සඳහන් කර ඇත. මම දන්නේ නැහැ විගණක ඉදිරිපත් කරපු එකේනම් 22ක් නැහැ, අයේ 22ක් ගැන කියමින් කියනවා, වාහන ආදයම් බලපත්‍ර ලබා නොගත් වාහන 19කි. මන් කියන්නේ මොකද්ද මේ පිස්සුව, මම කියන්නේ එය අවසානයේ 19 කියලා පිළිගෙන තියෙනවා, මේ උඩ 22 ලෙස සඳහන් ඇත කියන එකේ තේරුමක් තියෙනවානේ මෙහි ඉතා පැහැදිලිව සටහනක් තියෙනවානේ, ඒ කියන 22 තියෙන්නේ කොහෙද

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, නිශාන්ත මන්ත්‍රීතුමා දැන් කියන්නේ මෙන්න මේ කාරණය. විගණනයෙන් කියනවා 19ක් කියලා ඔබ කියනවා 22ක් කියලා ඒකයි මේ අහන්නේ,

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෙහි සටහන් කරලා තියෙනවා 22ක් කියලා කොහෙද ඒක තියෙන්නේ,

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔවුන් මුලින්ම අපිට ඉදිරිපත් කරනවා, වාහන 22ක් තියෙනවා කියලා. පස්සේ නැවත ඒගොල්ලොම කියනවා 19 ක් කියලා, අපි කියනවා වාහන 22 ක් ලෙස සඳහන් කර ඔබ ඇතත් බලපත්‍ර නොමැතිව තිබෙන්නේ 19ක් කියලා ඒකයි කියන්නේ. මේ අයගේ මුල් වාර්තාව වැරදි ඒ අනුවනේ අපි පිළිතුරු සපයන්නේ

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, පැහැදිලි අපි බලන්නේ අපිට එවන වාර්ථාවනේ. මම මහජන නියෝජිතයෙක් හැටියට මට එවන විගණන වාර්ථාව තමයි මම කියවන්නේ, ඒ වාර්ථාව කියවගෙන යනකොට මේ වාහන 22ක් ගැන සඳහන් කරලා තියෙනවා, මම දැන් බලනවා 22ක් කොහෙද තියෙන්නේ, එතකොට විගණක කියනවා 19යි කියලා. එහෙනම් මම යන්න ඕනෑ මාගේ කාලය අරගෙන ආදාල ෆයිල් එක බලන්න කොමසාරිස්තුමා ළගට.

**සභා ඝෝෂා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කලේ මේ ප්‍රශ්න කිරීම නිවැරදි කර ගැනීම එතකොට ඒක හරි, වාර්ථාවේ ඒ විදිහට තියෙනකොට ඒ විදිහට ප්‍රශ්න එනවා එතකොට ඔබ ගොනුව බලලා තමයි නිවැරදි කරන්න ඕනෑ, මේ බොහෝ දේවල් වල විගණක විසින් ඉදිරිපත් කරලා තියෙන කරුණු කාරණා පිළිබඳව අපි ඔවුන්ට ස්තූතිවන්ත වෙනවා මොකද ඔවුන් යම් මහන්සියක් දරමින් මේ කටයුත්ත කරන්නේ මේ ආයතනයේ යහපත වෙනුවෙන් මිසක් කිසිකෙනෙක් සමඟ පුද්ගලික තරහක් ඔවුන්ට නැහැ. ඒ වගේම මේ මොරටුවේ ජනතාවගේ යම් බදු මුදල් ප්‍රමාණයක් ඔවුනට ගෙවනවා ඒක නිසා අපි දැන ගන්න ඕනෑ මෙය වඩාත් අපේ දේශපාලන අරමුණු පැත්තකින් තියලා මේ දේවල් නිවැරදි කර ගන්න අපි මොනවද කර ගන්න ඕනෑ කියලා, සභාවක් ලෙස හිතනවා අපි විපක්ෂය විදිහට උත්සහ කළේ මේ සාකච්ඡාව ඇතුළේ වියයුතු දේවල් පෙන්වා දෙමින් ඒවා නිවැරදි කරගැනීම සඳහා මේ ලේඛනයට ආදාල ඉදිරිපත් කරන කරුණු බොහොමයක් පිලිගනිමින් ඒවා නිවැරදි කරගන්න එකඟවෙනවා. නමුත්, ඒක කියනකොට ස්වභාවය තමයි පිළිගන්න කැමති නැහැ. වැරදි කරලා නැති බව තමයි දිගින් දිගටම ඔබේ ස්ථාවරය නමුත් වැරදි කරපු බව තමයි අපේ ස්ථාවරය, ඒවා නිවැරදි කර නොගන්නා බව තමයි ඔබ ඔප්පු කරමින් ඉන්නේ. විගණක වාර්ථාවට විතරක් නෙවෙයි මෙය සීමාවෙලා තියෙන්නේ අපේ ඇස්පනාපිට මම කියන්නේ විගණක ගියේ නැති, දැන් මේ කතා කරනවා වාහන බලපත්‍ර රක්ෂණ සහතික එයා ගිහිල්ලා කෙලින්ම අපේ වාහන පරික්ෂා කළානම් පුද්ගල ලයිසනුත් නැහැ, ඒ නිසා විගණක ගියොත් මේ ස්ථාන වලට මීට වැඩිය, මිනිස්සුන්ගේ යහපත වෙනුවෙන් මම මේ කියන්නේ ඔබට, අපි ජනතාවගේ පහසුව වෙනුවෙන් ගල් අල්ලලා දුන්නා දිගටම දෙපැත්තේ හැබැයි ඒවා නඩත්තු වෙන්නේ නැහැ ඒවා දැන් ඔක්කෝම විනාශ වෙලා, මේ වැඩි ඇතක නෙවෙයි. මෙවා තමයි ගැටළු, මිනිස්සුන්ගේ යහපත වෙනුවෙන් ලක්ෂ ගණන් වියදම් කරලා. සේවකයෝ මෙහි ඕනෑතරම් ඉද්දි අද යන්න විදිහක් නැහැ අපි මේවා නඩත්තු කරන්නේ නැහැ ඒ වගේ දේවල් ගණනාවක් තියෙනවා, ඒවා කොච්චර කිවුවත් ඔබ හැමතිස්සේම ඔබේ දේශපාලන උවමනාවට යට කරනවා ඔබ කිසිවිටක බරකින් ඒවා ගන්නේ නැහැ. ඒ නිසා මේ ගැන මීට වැඩිය කතා කරන්න අවශ්‍ය නැහැ. අපි මේ ආවේ මෙහි තිබේන සැබෑ දේවල් මීට පෙර විගණක වාර්ථා ඕනෑතරම් මීට වැඩිය ගැඹුරු චෝදනා සහිතව තිබුණත් අවස්ථාවක් ලැබුනේ නැහැ, නිකන් සභාව වෙලාවේ මොනවා හරි කතා කළා ඒකයි මේ විශේෂ අවස්ථාව ගැන මම ස්තුතිවන්ත උනේ. අපි වාදවිවාද කරමු සභාවේ අදහස් දක්වනවා කියන්නේ අපේ අයිතියක්. එතකොට ඒ අදහස් වල සමහර දේවල් වලට එකඟවෙන්න පුළුවන් අවස්ථා බැරි අවස්ථා තියෙනවා, අපි ආවේ සංවාද කරලා ඒවා විසඳගන්න. ඒකට අවස්ථාව ගන්න අපි අවේ. නැත්නම් සුපුරුදු දේශපාලන වාග් ප්‍රහාර වලින් මෙය ඉවර කරලා යන්න නෙවෙයි. නමුත් ඒ කටයුත්ත ඒ ආකාරයෙන් සිදුකර ගන්න හම්බවුනේ නැහැ කියන එක තමයි මගේ අදහස ගරු නගරාධිපතිතුමනි.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යනවාද ඕකතමයි වෙලා තියෙන්නේ මාධ්‍යට කතා කරලා ඔබතුමන්ලා යනවා. ගරු අණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ අවදානයට, ජනතා විමුක්ති පෙරමුණ ගියානේ. කියලා ගියා මේ වාර්ථාකරණය කරන්න කට්ටියත් ඉන්නවද දන්නේ නැහැ, ඒ අයත් ගියාද දන්නේ නැහැ. දැන් මෙහි තියෙනවා චක්‍රලේඛන උපදෙස් ප්‍රකාරව හා නව ගිණුම් ක්‍රමයට ආදාලව ගනුදෙනු කළයුතුය. සමහර වෙලාවට කියනවා මෙහි මම තැන් දෙක තුනක දැක්කා මේ නිශාන්ත මන්ත්‍රීතුමා කියන ඒ මට තේරෙන්නේ නැහැ ඇයි අපේ අය මෙහෙම කියන්නේ කියලා, මේවා තමයි මම නිලධාරින්ගෙන් දැක්ක වරද. වසර සඳහා වූ අතිරික්තය 2022 වර්ෂයට ක්ෂයවීමට ආදාලව වෙන්කිරීම සිදුවී නොමැති බැවින් ක්ෂය වීමට ආදාලව ගිණුම් සකස් කරන ක්‍රමවේදයට පසුව අපි කරන්නම් කියලා, මෙහි තියෙනවානේ ක්‍රමවේදයට කරලා නැහැ කියලා, උත්තරය යවලා තියෙන්නේ ක්‍රමවේදයට කරන්නම් කියලා. හැබැයි එහෙම කරන්න බැහැ ලොකු වරදක් කරලා තියෙන්නේ ඔබතුමාලා. අවසානයේ පර්ලිමේන්තුවට මාව කැදෙවුවොත් මම ඔබතුමන්ලා දෙන උත්තර දීලා මට පාර්ලිමේන්තුවේ බේරෙන්න බැහැ මොකක්හරි වෙනවනම් වෙන්නේ මට ගණන් තබන නිලධාරියා විදිහට මම මෙයට උත්තර දෙන්න ඕන. හැබැයි ඔබතුමාලා ලොකු වරදක් කරලා තියෙනවා. එ වරද නිවැරදි කර ගන්න. මෙහි පැහැදිලිවම තියෙනවා 2021 2155/6 2019 දෙසැම්බර් මස 24 වන දින අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වෙන්නා වූ 84 රීතිය අනුව තමයි අපි මෙයට අනුගත වෙනන් ඕන කියලා. හැබැයි එහෙම එකක් පනතෙන් කරන්න බැහැ. පනතේ 282 වගන්තියේ ඔබතුමිය මෙය පොඩ්ඩක් ඔලුවට ගන්න. රවීනාත් මහත්තයත් මෙය සැලකිල්ලට ගනි මොකද එතුමාත් මේ සම්බන්ධයෙන් සැලකිවයුතුව වගකියන මහත්මයෙක් විදිහට. එතුමා දෙයක් ක්ෂනිකව කටයුතු නොකරන කෙනෙක් නිසා එතුමා මෙය පිලිබඳව සැහිමකට පත් වෙයි මෙහි 289 කියනවා පැහැදිලිවම මේ ගැසට් එක නිකුත් කරන්නේ අණ්ඩුකාරවරිය විදිහට සීතා අරඹේපොළ මැතිණිය තමයි. ඒ ඉදිරිපත් කරන ගැසට් එක එතුමියට ඉදිරිපත් කරන්න පුළුවන් එකකින් නෙවෙයි එතුමිය ඉදිරිපත් කරන්නේ, ඒ ගැසට් එක අනුව එතුමිය විසින් මෙන්න මේ ගිණුම්කරණ යටතේ පවත්වාගෙන යන්න ඕනෑ කියන එක එතුමිය කරලා තියෙන සම්පූර්ණ වරදක්, ඒ වරදට අපිට විගණකාධිපති විසින් අපිට දෙනවනම් මේ විදිහට කරලා නැහැ කියලා මේ එකකටවත් අපි උත්තර බඳින්න ඕනෑ නැහැ. එකෙන්නම් අපිට ගහන්නේ මේ එකක්වත් වලංගුත් නැහැ එහි පැහැදිලිවම තියෙනවා 289 (1) "මේ ආඥා පනතේ විධිවිධාන වලට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා පොදු වශයෙන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සෑදීමට මේ ආඥා පනතේ බලය දී හෝ නියමකර තිබේනම් මේ කාරණය සඳහා යම් කාරණයක් සම්බන්ධයෙන් නියමකර තිබේනම් එම කාරණය සඳහා අමාත්‍යාවරයා විසින් නියෝග ලැබීය හැකිය", ඊට පස්සේ කියනවා "ඒ වගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනතුරු එය අනුමත ගැසට් පත්‍රය පළ කරන ලබන කිසිවක් වලංගු නොවන්නේය" එතකොට පාර්ලිමේනතුව කියන්නේ 13වන අණ්ඩුක්‍රම සංශෝධනයෙන් පස්සේ එය පළාත් සභාවට ගියා. එක පළාත් සභාවක් තියෙන වේලාවක විතරයි මේ ගැසට් එක දෙන්න ඕනෑ එහෙම නැතුව මෙය අණ්ඩුකාරවරයාට ගැසට් එක දෙන්න බැහැ, ඒ අණ්ඩුකාරවරයා දීපු ගැසට් එකෙන් තමයි අපේ අය උත්තර කෙකරබාබා හිටියේ ඒ උත්තර නොදී හිටියා ඒකට හේතුව තමයි කොයි වෙලාවේහරි අපිව කෝප් එකට කැදෙවුවොත් අපි දුන්නේ නැත්තේ ආණ්ඩුකාරවරයාගේ බලය ඉක්මවා පළාත් සභාවක් නැති වෙලාවේ පළාත් සභාවේ අනුමැතියක් නැතුව ගැසට් එකක් නිකුත් කරලා තියෙනවා එ අනුව අපිට මුකුත් කරන්න බැහැයි කියලා කියන්න අවස්ථාව අපිට තියෙනවා. මේ විගණනය කරන්න ඕනෑ වෙන්නේ මේ අය මේ විගණනය කරලා තියෙන්නේ. ඔබතුමිය වුට්ටක් මෙය බලන්න, මෙහි තියෙනවා දෙවන පිටුවේ 2021 55/6 2019 දෙසැම්බර් මස 24 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පනවන ලද මහා නගර සභා මුල්‍ය පරිපාලනයට ආදාලව රීති අංක 84 නගර සභාව විසින් පළාත් පාලන ආයතනය සඳහා වූ. මෙය කරන්න බැහැ ආණ්ඩුකාරවරයෙකුට කරන්න පුළුවන්දේ ඕක නෙවෙයි. ආණ්ඩුකාරවරයෙකුට කරන්න පුළුවන් දේවල් තියෙනවා. එහෙම එකක් අපිට එවලා තියෙනවා ආණ්ඩුකාරවරයෙක් එක කරන්න පුළුවන් දේයක් සභාවේ බලය කියන එක ආණ්ඩුකාරවරයාට යන්නේ නැහැ මහා ඇමතිගේ බලය ආණ්ඩුකාරවරයාට යනවා. මහා ඇමතිගේ බලය ආණ්ඩුකාරවරයාට ගියාහම ඒකෙනුත් අපිට එවලා තියෙනවනම් ඒ රීතිය හරි මේ එවලා තියෙන්නේ සභාවේ රීතිය එක ආණ්ඩුකාරවරුන්ට ඕනෑ ඕනෑ විදිහට පාලනය කරන්න බැහැ. මේ ගැසට් එකම සම්පූර්ණ වැරදි. මේ ගැසට් එකෙන් මේගොල්ලෝ පිළිතුරු යවපු එක සම්පූර්ණ වැරදි. අපි ලියලා යවලා තියෙනවා මෙහි ගැටළු තියෙනවා කියලා, විගණනය පළමුවෙන්ම කරන්න ඕනෑ කවුරුහරි ගැසට් එකක් දැම්ම එය පමුණුවන්න බැහැ. ඒක නිකුත් කරන්න බැරි

එකකනම් ඒක විගණනය කරලා ඉන්න එපැයි. නිත්‍යානුකූල වෙන්නේ එතකොටනේ. විගණනය කරලා තියෙන්නේ ගලපගන්න බැරි එකක් එක්කනේ. ඒ දීලා තියෙන ආකෘතිය විදිහට හදන්න බැහැ. නීති පනවන්න පුළුවන් හැබැයි ඒ සභාවට විතරයි, සභාව කියන්නේ පළාත් සභාවට. පළාත් සභාව නැති වෙලාවක ආණ්ඩුකාරවරයට බැහැ ඒක කරන්න ඒතකොට විගණනය විගණනය කරන්න වෙනත් ආයතනයක් ඕනෑ වෙනවා. මම මේ නිශාන්ත මන්ත්‍රීවරයාට කියන්න හිටියේ, එතුමා ශාන්ත දාන්ත තීන්ත කුඩුව වගේ විගණනය අතගාලා විගණනය පව් කියලා විගණනය හරි හොදයි විගණනය පළවෙනි එක කරලා තියෙන්නේ වැරැද්දක් විගණනය කරන්න පුළුවන් නීතියක් නැති එකකින් නීතියක් හදාගෙනනේ විගණනය කරලා තියෙන්නේ,කොහෙද කියන්න කලින් එතුමා මෙතනින් ගියානේ, කාගේ පාලනය කාලේද කියලා හොයන්න එපා ආව ලිවුම හරිද වැරදිද කියලා ඉස්සර වෙලා බලලා ඉන්න.

**සභා ඝෝෂා**

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා අපිට මේ විගණන වාර්ථාව සම්බන්ධව සාකච්ඡාවක් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඉල්ලුවට පස්සේ ඒ සාකච්ඡාව ලබා දීම ගැන මම වැඩි වේලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම හිතනවා මගේ යුතුකමක් තියෙනවා කියලා මෙම විගණන වාර්ථාව සම්බන්ධව යම් අදහස් කිහිපයක් බෙදා ගැනීමට බොහෝදුරට අපේ අවසාන අවස්ථාව වෙන්න පුළුවන්. කෙසේ වෙතත් මම මෙය ප්‍රයෝජනයට ගන්නේ මම ජ්‍යෙෂ්ඨ පුද්ගලයෙක් හැටියට මගේ යුතුකමක් තියෙනවා නගර

සභාවේ මන්ත්‍රීවරුන් සමඟ මම දන්න වැදගත් කියලා හිතෙන කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. මට මතකයි අපි ගොඩක් වේලාවට ඔඩිට් එක කියලා කිවුවම අපි ඔඩිට් එකත් එක්ක විශාල ප්‍රශ්න ඇති කර ගන්නවා, මම හිතන විදිහට මේ ඔඩිට් එක කියන්නේ ඉන්ටර්නල් ඔඩිට් වෙන්න පුළුවන් ගවමන්ට් ඔඩිට් වෙන්න පුළුවන් මේ අය අපිට ඉතාමත් ප්‍රයෝජනවත් වෙන්න පුළුවන් මට මතකයි ගරු නගරාධිපතිතුමනි, 2002 දී මේ සභාවේ නගරාධිපති වුණු අවස්ථාවේ මාව ඇවිත් මුණගැහුණු ගවන්මන්ට් ඔඩිට් එකෙන් හමුවෙලා මට කිවුවා එ අයට පහුගිය කාලවල ඔඩිට් එකක් කරන්න යම් ස්ථානයකට යනකොට කිසිම අවස්ථාවක නගර සභාවෙන් අවශ්‍ය වාහනයක් හෝ කිසිම දෙයක් සපයලා දුන්නේ නැහැ කියලා. දැන් අපේ ඉන්ටර්නල් ඔඩිට් එකට දුන්නම යම් තැනක් ගිහින් පරික්ෂා කරන්න කියලා ඉන්ටර්නල් ඔඩිට් යන්න කලින් කෝල් කරලා කියනවා අපි දැන් එනවා කියලා එතකොට මිනිස්සු ඔක්කෝම එම ස්ථානවල ඉන්නවා. මම පාලනය භාර ගන්න කාලයෙදී එ පරණ දේශපාලනයේ හිටපු මන්ත්‍රීවරු දන්නවා ඇති මේ නගර සභාවේ තිස්සේම බීලා ඉන්න ජොෂ්ඨ නිලධාරින් පවා හිටියා. ඊට අමතරව සේවකයින් ඒ ස්ථානවල ඉන්නේ නැහැ. ආපු ගමන් අපි කරන්න ගත්තේ මේ අයව නැවත හරි මාර්ගයටගන්න එක. මම ගවන්මන්ට් ඔඩිට් එකට කිවුවා කරුණාකරලා සියලුම වැරදි තියෙනවනම් හොයලා බලන්න මොකද ඔයාලා හොයලා දෙන වැරදි අනුව තමයි මට මේ පරිපාලනය හරියට හදාගෙන යන්න පුළුවන් කියලා. එහෙම කියලා මම එයාලට කිවුවා එයාලට වාහනයක් ඕන වෙන ඕනෙම අවස්ථාවක කිසි කෙනෙකුට කියන්න එපා කෙලින්ම මට කියන්න මේ වේලාවට වාහනය ඕන කියලා මම මගේ වාහනයයි මගේ ඩ්‍රයිවයි දෙන්නම් ගිහිල්ලා ඒ තැන් චෙක් කරන්න. ඒ දේ තමයි අපි කෙරුවේ. කරලා ඔඩිට් එකේ නිලධාරින් ඔඩිට් ජෙනරාල්ට පවා කියලා තිබුණා මොරටුව මහා නගර සභාවෙන් විශාල සහයෝගයක් දුන්නා කියලා. මම බැලුවේ මෙය ප්‍රශ්නයක් හැටියට නෙවෙයි අපි අපේ දුර්වලතාවයන් හඳුනා ගත්තොත් අපේ පරිපාලනයට බොහොම ප්‍රයෝජනවත් වෙනවා කියලා. විශේෂයෙන්ම මේ කියන්න හැදුවේ මන්ත්‍රීවරුන්ට අපි ප්‍රශ්න ඇති කර ගත යුතු නැහැ අපි මෙයින් දේයක් ඉගෙන ගෙන ඉස්සරහට යන්න ඕන මම මේ වාර්ථාව කියවනකොට මට තේරුණා මෙහි අපේ එකවුන්ට් පැත්තේ යම් දුර්වලතා තියෙනවා. මේ සම්බන්ධව අපි මීට වඩා සැලකිලිමත් වෙලා නිතර අපි රැස්වීම් තියලා අපේ අඩුපාඩුකම් හොයලා බලලා එවා පිලියෙල කර ගැනීම අපේ යුතුකමක්. මේ වාර්ථාව අපි කියවලා තියෙන්න ඕන. මෙහි තියෙන අඩුපාඩුකම් අර තියෙන පනතට එකඟ නොවුනත් මෙහි කියලා තියෙන යම් සාධනීය දේවල් තියෙනවා ඒවා අපි අනුගමනය කෙරුවොතින් අපේ ඊළඟ වර්ෂයෙ දී මේ තියෙන ප්‍රශ්න රැසක් අපිට අඩුකර කරගන්න පුළුවන් කියන එකයි මගේ අදහස. අපේ නගරාධිපතිතුමා කිවුවා වගේ මෙහි ගැටළුව වෙලා තියෙන්නේ අර අලුතෙන් ඉදිරිපත් කරපු පනත අණ්ඩුකාරතුමිය එක ක්‍රියාත්මක වෙන්නනම්, මම මේ සම්බන්ධව ලේකම්තුමාගෙනුත් උපදෙස් ටිකක් ගත්තා. එය ක්‍රියාත්මක වෙන්නනම් පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පළාත් සභාවක අනුමැතියකින්

තොරව අණ්ඩුකාරතුමාට මේ බලය ලබා දෙන්න බැහැ,මෙන්න මෙයයි ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ එය කොහොම වෙතත් මෙහි හොඳ දේවල් ටිකක් කියලා තියෙනවා. අපේ එකවුන්ට් ඩිවිෂන් එකට මේ සම්බන්ධව ඔවුන්ගේ අවදාන යොමු කරලා මේ පනත තිබුණත් නොතිබුත් මෙහි තියෙන හොඳ දේවල් හොයාගෙන අපිට පුළුවන් එ ගිණුම් කරනය කරගෙන යන්න එක ගොඩක් හොඳයි. තව එකක් කියන්න තියෙනවා මම හිතනවා මේ වචනේ හරි කියලා, වත්කම් ප්‍රත්‍යාගණනය, තව එකක් තිබුණා ක්ෂය වීම දැන් මෙච්චා කරලා නැහැ මෙවා ඔය පනතෙන් එනන් ඕන දේයක් නෙවෙයි. නමුත් මෙය මුලිකව ගිණුම්කරණයේ තියෙන සිද්ධාන්තයන් මෙවා අපිට කරන්න පුළුවන් වෙන්න ඕන. එකවුන්ට් එකක් රිපන්ටිසයින් කරන්න පුළුවන්වෙන්න ඕන, අපේ තියෙන වත්කම් ක්ෂය කරන්න එ ක්‍රමවේදයන් තියෙනවා.එවා අපි අනුගමනය කරලා එ කටයුතු කරගෙන ගියොතින් මම හිතනවා අපිට ලබන අවුරුද්දේ මේ විශාල ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. කෙසේ වෙතත් මම සන්තෝෂ වෙනවා මේ විගණන වාර්ථාව මීට පෙර ලැබුණ වාර්ථා එක්ක බලනකොට මහා හයානක එකක් නෙවෙයි. අපි යම් තැනකට ඇවිල්ලා තියෙනවා.මෙය අපි තවත් දියුණු කර ගන්න බලමු අපි කාගෙත් වගකීම මෙය අපි මෙහි වරදක් දැක්කොත් ඔබතුමාට ඇගිල්ල දික් කරලා කියන්න ඕන මෙය හදන්න කියලා. එය අපේ යුතුකම ආණ්ඩු පක්ෂයට කියන්න ඕන ඔයාලා මේ කරල දේ වැරදි මෙය මේ පිලිවෙලට හදන්න කියලා. අන්න එ කටයුත්ත කරගෙන මෙය ගියොතින් ඊළඟට කවුරු බලයට ආවත් මේ ප්‍රශ්න විසඳලා අපි යම් මාර්ගයකට මේ සභාව ගෙනල්ලා තියෙනවා. එ කාරණාව කියලා මම ගරු

නගරාධිපතිතුමාගේ අවධානයට යොමු කරනවා කාරණා තුන හතරකට පිලිතුරු දෙන්න පුළුවන්නම්. මේ වාර්ථාවේ දෙවෙනි කොටසට යනවා, ජුනි 26 කොටසේ පිටු අංක 04 එහි තියෙනවා (ඊ) ලැබිය යුතු ගෙවිය යුතු ගිණුම් රෝම ඉලක්කම් 1 එකේ තියෙනවා නගරාධිපතිතුමා සැහැල්ලු කසළ ඉවත් කිරීම වෙනුවෙන් සභා බල ප්‍රදේශයේ ආයතන 763කින් මිලියන 48 මුදලක් මෙම ශේෂයතුල 2012 සිට 2020 දක්වා ආදාලව ගෙවිය යුතු අයවිය යුතු මිලියන 36 මුදලක් අපි අය කරගෙන නැහැ කියලා මොකද්ද එයට කරන්නේ එක අරගන්න යනවද,

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ක්‍රියාමාර්ගයක් ගන්න බැහැ එයට හේතුව ගන්නවනම් ගන්න ඕන ආදාල වර්ෂයේ සැප්තැම්බර් මාසය අවසාන වීමට පෙර. එවා දැන් අපේ පැත්තෙන් එකට ආදාල වන්නා වු විගණනය කිරීම කරන්නේ අපි විසින් කරන ලද බජට් එකේදි එ සැහැල්ලු කසල වලින් මෙච්චර ලැබෙන්න තියෙනවා ආයතන වලින් මෙච්චර ලැබෙන්න තියෙනවා කියන තොරතුරු පදනම් කරගෙන තමයි අපිට මේ ඔඩිට් කරලා තියෙන්නේ. නමුත් ඇත්තටම මෙය කසල වලට ඔය විදිහට එකතු කිරීමේ කටයුත්ත කරන්න ගත්තේ පළාත් සභාව කසල වලට වත්තට අය කරන්න ගත්ත දවසේ ඉදලා එහිදි ඔවුන් ප්‍රඥප්තියක් පැනෙව්වා ටොන් එකකට කොච්චරක්ද ගන්නේ කියලා. එ නිසා අපිට සිද්ධ උනා ව්‍යාපාරික ස්ථාන වලින් මෙය ගන්න මෙහිදි අපිට නිත්‍යානුකූල පදනමකට යනවිට සැප්තැම්බර් මාසය අවසාන වීමට පෙර මේ ආදාල වන්නා වු මොනවා හරි මුදලක් ගැනීමේ කටයුත්ත කරන්න ඕන. අවුරුදු ගණනක් තිස්සේ අපි මේ කරගෙන යන කටයුත්ත යම් හේතුන් මත ප්‍රමාදයක් ඇති උනා අපිට නිවැරදි විදිහට කරන්න බැහැ ව්‍යාපාරය කරන්නෙත් කුමන හෝ වක්‍රබදු කිහිපයක් සභාවට ගෙන එමින් එ නිසා ඕකකෝම අපි ගෙන්නලා අඩු වශයෙන් මේ මිලියන 48 කියන එකෙන් මිලියන 30 විතර තියෙන අයව ඔක්කෝම ගෙන්නුවා ගෙනල්ලා ඔවුන් එක්ක කතා කරාම එකඟතාවයකට ආවා ගෙවන අයත් හිටියා යම් අය කිවුවා නැහැ අපිට ගෙවන්න විදිහක් නැහැ කියලා. මේ පදනමට ගිහින් අපි මේ රටේ තත්ත්වය ගැනත් හිතලා, අපි නිගමනයකට ආවා අපි සම්පින්ඩන වාර්ථාවක් එවනවා ඉලඟ සභාවට හේතුත් එක්කම.

<u>**මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, එ යටතේම රෝම ඉලක්කම් 3 විදි පහන් නඩත්තු කිරීම සම්බන්ධව ලක්ෂ 101 මුදලක් එ සම්බන්ධව මොකක් හරි කටයුත්තක් කරගෙන යනවද.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මෙය පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා විදුලිබල අමාත්‍යවරයා වුණ අවස්ථාවේ අපිට එව්වා බිල් 4ක් මාස 4කට එව්වා ලක්ෂ 5 ගානේ ලක්ෂ 20ක් එතකොට හිටියේ කරුණාරත්න කොමසාරිස්තුමා, එතුමත් අපිත් ගියා සාකච්ඡාවට සභාපතිතුමාගෙන් ඇහුවා මුළු සමස්ථයම තියෙන්නාවු දාරිතාවයෙන් 2.5% ක් විදි පහන් වලට වැය කරන්න ඕන ඔබතුමා ගණනය කරලා තියෙනවද වොට් 125ක් දැවෙන එක අපි වොට් 15 විතර ගෙන්න අපි LED බල්බ් දැම්මා. කොහෙමද ගණනය වැරදුනේ කියලා. කිවුවම කිවුවා අපි බිල් එවන්නේ නැහැ කියලා එකට අපි උත්තර ලියනවා අපිට එවන්නේ නැහැ මෙය දේන්නේ නැහැ මෙය නතර කරලා

තියෙන්නේ කියලා. අපි කියන එක ලියන්නේ නැතුව මෙයම ලිය ලිය ඉන්නවා මම දන්නේ නැහැ ඇයි කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එතකොට පිටු අංක 5 (5) දීර්ඝ කාලයක් සිට පැවත එන එකතුව ලක්ෂ 41 ලැබිය යුතු ශේෂ 6ක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයෙදි අපොහොසත් වී තිබේ. මේ සම්බන්ධයෙන් දැන ගන්න අවශ්‍යයි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ අවුරුදු 25ක 30ක ඉඳලා ලේඛන පවත්වාගෙන ඇවිල්ලා නැහැ. මෙයට උත්තර දෙන්න අපිට ලේඛන නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 11 වෙනි පිටුවේ 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය සඳහා ලැබිය යුතු ලක්ෂ 15ක එකතු කළ අභයෙන් කිසිම මුදලක් ලබා ගැනීමට සභාව අපොහොසත් වී ඇත. එ ගැන යම් පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මෙහි වෙලා තියෙන්නේ අපි එතනට ගිය මුදල ගන්න ගියාම මෙහෙන් කපලා එවපු ප්‍රමාණය මදි කියලා. අපෙන් ගන්න වෙනවලු එගොල්ලන්ට ලක්ෂ 45ක් 50ක් විතර. එයාලා කියලා තියෙනවා නිහඬ වෙන්න ඕක අතහරින්න නැත්තම් මෙය උඩ එනවා කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉලහට 12 පිටුව 2019 සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මිලියන 44ක්.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

අපි 2019 දින 180 සම්පූර්ණ අයව ස්ථිර කරන්න කිවුවනේ එක.

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, තව කරුණු තියෙනවා එවා ගැන අනිත් මන්ත්‍රීවරු කතා කළා එ නිසා මම නැවත කතා කරන්න ඕනේ නැහැ කියලා හිතනවා, මම දන්නවා ඔබතුමා මේ සම්බන්ධයෙන් අවබෝධයෙන් කටයුතු කරනවා කියලා, තවද මට කියන්න තියෙන්නේ නිලධාරින්වත් එකකාසු කරගෙන උත්තර දෙන්න පුළුවන් එවට උත්තර දෙන්න කියලා, තවද එකවුන්ස් විඩිෂන් එක පිළිබඳව අවබෝධයක් ඇතිව රැස්වෙලා මේ කටයුත්ත කරන්න පුළුවන්නම් හොඳයි. අවසාන වශයෙන් මම දැක්කා 13වන පිටුවේ (ආ), වරිපනම් අංශයේ පරිසනක අංශයට අනියුක්ත කර ඇති සේවකයෙක් විසින් පොදු මුරපදය අවභාවිතයක් සම්බන්ධව මෙහි සඳහන් වෙනවා. මෙයට ඔබතුමාගේ අවදානය යොමු කරන්න කැමති මේ පරිගණක ගත කිරීම් කෙරුවේ මාගේ කාලයෙදී, එය කලේ කොළඹ කැම්පස් එකෙන්, එකේ ආචාර්යවරු ඇවිත් මාව හමුවෙලා මට කිවුවා මෙන්න සිස්ටම් එක දැන් මෙය හරි කියන වෙලාවේදි මට කිවුවා මෙහි මුරපදය අපි නගරාධිපතිවරයාට දෙනවා එහි කටයුතු කරන්න කියලා, නගරාධිපතිවරයාට විතරයි මෙහි කටයුතු කරන්න පුළුවන් කියලා කිවුවා. මම එ වෙලාවේ කිවුවා එක කරන්න එපා මට මම ගැන විස්වාසයි එත් මගෙන් පසු එන අය ගැන කියන්න බැහැ එ අය මෙය වැරදි පිළිවෙලට පාවිච්චි කරන්න පුළුවන් එම නිසා මෙය නගරාධිපතිවරයා, කොමසාරිස්තුමා, එකවුන්ටන් යන තුන් දෙනාම ඇතුළුව පමණයි මෙහි මොකක් හො මාරු කරන්න සහනයක් දෙනවනම් එ දේවල් කරන්න පුළුවන් මේ තුන්දෙනාගෙන් පාස්වර්ඩ් එක දාන්න ඔන කියලා, එයාලා එය පිළිගෙන එ අනුව වෙනස් කළා. මට පේන විදිහට දැන් මේ පාස්වර්ඩ් එක කවුරු හරි සේවකයෙක් අතට ගිහින් තියෙනවා. මම කියන්නේ මෙය වහාම නවත්තලා නගරාධිපතිවරයා, කොමසාරිස්තුමා, එකවුන්ටන් යන තුන් දෙනාම ඇතුළුව මෙහි පස්වර්ඩ් එක තියාගන්න කියලා තමයි මම කියන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගෙ අවදානය යොමු කරන්න කියමින් මම නිහඬ වෙනවා, ස්තූතියි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉතා කෙටියෙන් යමක් කියන්න තියෙනවා, මම පෙර අවස්ථාවේදි අර මාසික විගණන වාර්ථාව සම්බන්ධයෙන් ප්‍රශ්න නැගුවා එතකොට ඔබතුමා කිවුවා නගර සභාවේ නෙවෙයි කියලා විගණකාධිපති කියලා, මම වැරදිනම් නිවැරදි කරන්න මේ මොරටුව නගර සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම, අභ්‍යන්තර විගණන අංශය, මොරටුව මහා නගර සභාව විගණන වගකීම් මෙහි සඳහන් වෙනවා. මෙහි එක කොටසක සඳහන් වෙනවා මෙහි නොම්බර 20 විගණන කටයුතු මාසිකව විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම, ප්‍රමාදයකින් තොරව විගණන විමසුම් වලට පිළිතුරු දීම, අභ්‍යන්තර විගණන විමසුම සඳහා පිළිතුරු ගැනීම. මෙන්න මෙතන සඳහන් වෙනවා එතකොට මම කියපු දේවල් මෙයට ඇතුළත් වෙනවද නැද්ද. එය පැහැදිලි කිරීමක් කරන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඇතුළත් වෙන්නේ නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රි - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාගේ ලේඛනම තමයි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, ලේඛනයේ තියෙන එක නැවත ඔබතුමිය වැරදියටනේ කිවුවේ එහි තියෙන්නේ ලබාදෙන ඒවට පිළිතුරු දෙන්න ඕනෑ කියලා තියෙන්නේ. ලබාගන්න කියලා නැහැ. මාසිකව දෙන ඒවාට පිළිතුරු සපයන්න කියලා තියෙන්නේ. ඇයි ඔබතුමිය කැලි කැලි කියන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රි - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් තියෙනවා. අභ්‍යන්තර විගණන වාර්තාවක් දෙන්න කියලා ඇක්ට් එකේම තියෙනවා නම් එක ඇක්ට් එකට කම්බයින්ඩ් වෙන්න පුළුවන්ද බැරිද එතනින් එහාට ඔබතුමා මේ නිලධාරින්ගෙන් වාර්තාවක් ඉල්ලුවොත් මොනවාහරි දැනගන්න නිලධාරින් වාර්තාවක් දෙනවානේ. ඒවගේ තමයි මෙහි තියෙනවා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක්. විගණනයේ ෆන්ෂන් මොනවාද කියලා ඔබේ වගකිම සඳහන් කරනවා. විගණන අංශය මේ සම්බන්ධයෙන් මේ විවාදයක් නෙමෙයි. පොයින්ට් එකක් දිනන්න ඕනෑකමක් නැහැ. නගර සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් කියන්නේ. මට මෙයින් තර්කයක් දිනලා මට ලැබෙන දෙයකුත් නැහැ. මම කියන්නේ අවුරුද්ද අවසාන වෙනකොට මේවගේ වැරදිත් එක්ක වාර්තාවක් ඇවිල්ලා අපි මෙයට ඔබතුමන්ලා මෙයට ඔලුව කස කස බොහෝම අමාරුවෙන් මේගොල්ලෝ තීන්දු තිරණ දෙනවා. මාසිකව විගණන වාර්තාවක් ඉදිරිපත් කරන්න පුළුවන්නම් මෙතන මේ තියෙන ලේඛන මෙය හරියට තියාගන්නේ නැහැ. මෙය මාසික වාර්තාවක හයිලයිට් වෙනවානම් ඒවා රෙක්ටිෆයි කරන්න පුළුවන්. ඇක්ට් එකේ තියෙනවානම් ඔයගොල්ලන්ගේ වගකිම්වලත් තියෙනවානම් ඇයි වාර්තාවක් ඉදිරිපත් කරන්න බැරි. මෙයට විගණන අංශයක් තියෙනවානම් මාසික විගණන වාර්තාවක් දිම බාධාවක් නැහැ. ඒක තමයි මම මුලින්ම පැහැදිලි කළේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, පැහැදිලිවම ඔබතුමිය එය කියපු එකෙත් අඩුපාඩුවට කිවුවේ. බයයිනේ නඩුවකට කාවහරි එවන්න ඔබතුමිය ළඟට. අඩුපාඩුවෙන් කියලා නඩු පරදිනවානේ. මේ පනතේ තියෙනවා පැහැදිලිවම විගණකාධිපතිවරුන් විසින් මාසිකව ඒ මෙය තමයි තියෙන්නේ. එහිදි ඒකට උත්තර සැපයිමේ වගකිම පැවරෙන්නේ මෙහෙට. ඒක හරි හැබැයි එවන්නේ නැතිව උත්තර සපයන්න බැහැනේ. මහා නගර සභා ආඥාපනතේ 188 ඒ හි තියෙනවා වසංගත සුළිසුළං ඒ ඕනෑම දෙයකට සභාව විසින් දරණ සියලු මුදල් පිළිගන්න ඕනෑ කියලා සභාව වියදම් යටතේ. හැබැයි අපිව විගණනය කරනවා අර සහන මල්ල දිපු එකට විගණනය කරනවා. ඒ අයට මම

යැවුවා ඔබතුමියලා විගණනය කළේ කොහෙද? නගර සභාව, ප්‍රාදේශීය සභා පනත්වල මෙය නැහැ. හැබැයි ඒගොල්ලෝ පිළිගත්තා අන්තිමට මහා නගර සභා ආඥා පනතේ බලලා නෙමෙයි අපිව විගණනය කරන්නේ. මහා නගර සභා ආඥා පනතේ තියෙනවා පැහැදිලිවම එක පාරටම සුලි

සුළඟක් ගියානම් තහඩු දෙන්න. එය ප්‍රාදේශිය සභාවට බැහැ. නගර සභාවට බැහැ. එය කිවුවාට පස්සේ තමයි පිළිගත්තේ. අපි බලලා තියෙන්නේ ප්‍රාදේශිය සභා පනත කියලා. ප්‍රාදේශිය සභා පනතේ නැහැ. ඒවගේ ඔබතුමිය නැති දෙයක් ඒ කියන්නේ, අපිට ප්‍රශ්න එවන්න එවන්න නගරාධිපතිවරයෙක්ට සභාවට මෙයද කරන්න තියෙන්නේ. ඒ කියන්නේ කමක් නැහැ එවන්න කියලා ගෙන්න ගන්නවා. ගෙන්න ගෙන වැඩ මදිවට අපේ අභ්‍යන්තර විගණන කියනවා උත්තර යවන්න යවන්න මොකක්ද මෙහි තේරුම. මෙයද මේ කියන්නේ. මේ සභාව කියන්නේ මෙයටද? ඔබතුමියලා කරපු තව වරදක් තියෙනවානේ මොරටුවේ එස් සී එක දෙන්න එපා ඔප්පුව. හැබැයි විගණනය කරනවා මොරටුව මහා නගර සභාවට අයත් දේපලක් යම් පුද්ගලයෙක් විසින් තමන්ගේ ආදායමක් සේ උපයනවා. මොරටුව මහා නගර සභාව තමන්ගේ ආදායම අරගෙන නැහැ. හැබැයි ඒ අස්සෙත් කියනවා සීල් කරන එක වැරදියි. මෙය මට තේරෙන්නේ නැහැ. මෙය ඇගිල්ල දික්කරන්න ඕනෑ යුක්තියට, ඇගිල්ල දික්කරනවා ඇරෙන්න ඇගිල්ල දික්කරන්න එන්න බැහැ හැමතිස්සේම බැහැ. එසේම වරදිනවා ඇගිල්ල දික්කරන්න එපා, දැන් මෙහි බලන්න ඔබතුමිය කල්පනා කරලා මුලින්ම මම කිවුවා මෙහි විගණනය විගණකාධිපතිවරුන් විගණකාධිපති කියන එක ඔබතුමිය කිවුවා නැහැ අපි කියලා විගණකවරයා අභ්‍යන්තර විගණකට 100ක් විතර තියෙනවා විගණනය කරන්න සභාවේ

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අද මේ සාකච්ඡාව සම්බන්ධව සාධනීය පිළිතුරු ලැබුණා. අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමාගෙන් සාධාරණ පරීක්ෂණයක් කරලා මේ සම්බන්ධව වාර්තාවක් අපි සියලුම මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න

<u>ගරුනගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනේ, විශේෂයෙන් මම හිතනවා අපි සියලුදෙනා මේ එකතු වුනේ මොකක්හරි හොඳ දෙයක් කරන්න සභාවට. එහි කිසි විවාදයක් නැහැ. මොකද සමහර වෙලාවට මම ලිහිණි මන්ත්‍රීතුමිය කියන සමහර ඒවා පිළිබඳව එතුමිය ඉන්දැද්දි මම කථාකරන්න යන්නේ නැහැ. පස්සේ මම කථාකරන තැන් ඕනෑතරම් තියෙනවා. කථාකරලා නිවැරදි කරගන්න පුළුවන් තැන්වලට ගේනවා. රවිනාත් මහත්තයා සමහර වෙලාවට අපිට තාත්තා කෙනෙක් වගේ, නගරාධිපතිවරයෙක් වගේ කියන වෙලාවල් තියෙනවා. ඒවා එකක්වත් අතපසු කරන්නේ නැහැ. මොකද එහෙම හේතුවක් නැහැනේ. උදාහරණයකට ගත්තොත් තිසර මෙන්ඩිස් මන්ත්‍රීතුමා මොනවාහරි කිවුවා කියලා නැත්නම් නිරෝෂන් රුවමාල් මන්ත්‍රීතුමා මොනවාහරි කිවුවා කියලා එහි හරි දෙයක් තියෙනවා නම් එය ක්‍රියාත්මක කරන්න විතරයි තියෙන්නේ. හැබැයි එහිදී නිරෝෂන් කියන කෙනා වෙනම ම නමක් හදාගෙන සමන්ලාල් කියන කෙනාට ගහන්න ඕනෑ කිවුවාට ඒක මගෙන් කෙරෙන්නේ නැහැ. ඒවා කවදාවත් වෙන්නෙත් නැහැ. දැන් අපි කියමුකො සුජිත් පුෂ්පකුමාර කියන කෙනා තමන්ගේ යාලුවෙක් වෙනුවෙන් මෙය කලයුතුයි නගරාධිපති ඒක කවදාවත් වෙන්නේ නැහැ. හෙට තව අවුරුදු 4ක් ඉස්සරහාට ගියත් ඒකනම් වෙන්නේ නැහැ. හැබැයි ප්‍රභාෂිණි මන්ත්‍රීතුමිය කිවුවාම ලැබ් එකක් ඕනෑ පරීක්ෂණ පවත්වන්න. එය වෙන්න ඕනෑ කළා. හෙට ඔබතුමිය කිවුවොත් කාන්තාවන්ට මෙය කරන්න ඕනෑ කියලා සල්ලිත් වෙන්කරලා හැබැයි වැඩසටහනක් තාම දුන්නේ නැහැ. අන්න ඒවගේ දේවල් තියෙනවා. තාම දුන්නේ නැහැ. මේවායේ මගේ නම් කියන්නේ විගණනය කියන්නේ හරියට කෝච්චි පෙට්ටියක රෝද වගේ. ඔවුන් අපිව පීලි පැන්නුවාම ආපහු පෙට්ටිය තියෙනවා පීල්ලේ. පීල්ල හදලා ආපහු ඔබට යන්න කියනවා. ආපහු පීලි පැන්නාම කියනවා ඒ මේ හේතුව නිසා තමයි පීලි පැනලා තියෙන්නේ. නැවත පීල්ලේ තියෙනවා. ඒ ඇරෙන්න විගණනය කියන්නේ සමන්ලාල් උඹ හෙට පලයන් කියන එකක්වත් ඒක නෙමෙයි, හැබැයි ඒක මුල් කරගෙන මෙයා නිසා තමයි මෙය වුනේ කියලා විගණනයේ කොහේවත් කියන්නේ නැහැ. ඇත්ත දේ තමයි මේ කියන ඔක්කෝම මම කරන්නනම් මම වරලත් ගණකාධිකාරිවරයෙක් වෙන්න ඕනෑ, මම වරලත් ඉංජිනේරුවරයෙක් වෙන්න ඕනෑ, මම විශේෂඥ වෛද්‍යවරයෙක් වෙන්න ඕනෑ, මම ජනාධිපති නීතිඥවරයෙක්

වෙන්න ඕනෑ. මේ ඔක්කොම තියෙන තනතුරු එක්කෙනෙකුට හැර පළාත් පාලන ආයතන ප්‍රධානි කියන තනතුරකට ඉල්ලන්න බැහැ කියලා කොහේ හරි තිබුනොත් මේ සියලුම දේ හරියට වෙයි. එහෙම එකක් නැහැ. ඒ නොදන්න නිසා නොදන්නාකමට තමයි විගණනයක් කියලා තියෙන්නේ. වරදින එක නිවැරදි කරන්න තමයි විගණනය තියෙන්නේ. ඒ විගණනයෙන් කියන ඒවා කරන්න තමයි නිලධාරින් ඉන්නේ. හැබැයි මේ අපේ සමහර නිලධාරින් මේ ඉන්න එක නිලධාරියෙක්වත් හිතාමතාම මේවාට උත්තර සපයන්නේ නැතිව ඉන්නවා නෙමෙයි. උත්තර ලියනවා සෑහිමකට පත්වෙන්නේ නැහැ. දැන් මම කිවුවා මෙතුමන්ලාට ගිහිල්ලා ආණ්ඩුකාරතුමා විසින් කරලා තියෙන ඒවා තවත් මහා නගර සභාවල කරනවාද නැද්ද කරලා තියෙනවාද නැද්ද ඒ මහා නගර සභාවල විගණනය කරන අය ඒ විදියට කරලා තියෙනවා ද? නැද්ද? විගණනය කරලා වාර්තාවන් යවලාද? පොඩ්ඩක් පරික්ෂා කරන්න. ප්‍රශ්න වැලක් මේවා නිලධාරි කියන්නේ නැහැ. මම මහජන

නියෝජිතයෙක් නිසා මට මෙය කිවුව හැකියි. ඒනිසා එහෙම ඕනෑතරම් දේවල් තියෙනවා. විගණනය කළයුතු වන්නේ අපිව නිවැරදි කිරීමට මිසක් අපෙන් පලිගැනිමට නෙමෙයි. ලිහිණි මන්ත්‍රීතුමිය කථාකරන්න ඕනෑ ඔබ අපොහොසත් කියන එක නෙමෙයි මෙන්න මෙය කරන්න නගරාධිපතිතුමා මොකද මේ සභාවේ මම කවදාවත් පස්වෙනි පුටුවේ ඉදගෙන ඉන්නකොට කවදාවත් හිතුවේ නැහැ. මම නගරාධිපතිවෙයි කියලා හැබැයි මම සභාවට හරියට ආදරය කළා. ඒනිසා තමයි මෙතුමාගෙන් ගිහිල්ලා රු.16,000ක් රු.15,000ක් කළේ. කුණු වත්තට බාන එකේ රු.3,000ක් අඩු කළේ. සභාවට ආදරෙයි මෙතුමන්ලාට කරන්න බැරි සමහර ඒවා තිබුණා අපි ගිහිල්ලා අත්දෙකෙන් කරලා තියෙනවා. ඒ සභාවට ආදරෙයි මම හිතන්නේ ඔතන ඉන්න අයත් සභාවට ආදරය කරන්න මෙතනට ආවාම හරි ලේසියි කටයුතු කරන්න. සභාවට වෛර කරන්න යන්න එපා. වෛර කරන්න ගියාම වෙන්නේ මෙතනට ආවාට පස්සේ ඒ වෛරය නිසා තමන්ට මෙය කරන්න බැරිව යනවා. වෙන මුකුත් නෙමෙයි කරන්න ඕනෑ මට තේරෙන්නේ නැහැ ඇයි කියලා මොකද අපි ඔතන ඉදලා ගත්ත පියවර තියෙනවා රවිනාත් මහත්තයාට සමහර සභා කරන්න දුන්නේ නැහැ. එහෙම අවස්ථා තිබුනා. හැබැයි මොන වෙලාවේවත් රවිනාත් මහත්තයා එලවන්න ඕනෑ රවිනාත් මහත්තයා ගෙදර අරින්න ඕනෑ ඒවට අපි ඉඩ තිබ්බේ නැහැ. අපිට වුවමනාකම තියෙන්නේ රවිනාත් මහත්තයා කරපු හොද දේවල් වලට අපි අත උස්සලා තියෙනවා. වැරදි දේවල් විවේචනය කරනවා. දවස් දෙකහාමාරවල් තුනවල් සභා රැස්වීම් තියෙලා තියෙනවා. හැබැයි එක තැනකවත් අපේ හිටපු අනුෂ ගුණසේකර නිතිඥ මහත්මයා අනෙක් පැත්ත හැරිලා හැමතිස්සේම කිවුවේ මේ හැමදේටම විරුද්ධ වෙන්න නෙමෙයි අපි ඉන්නේ අදාල දේට විරුද්ධ වෙන්න කියලා. දැන් මට තේරෙන්නේ නැහැ විගණනයේ ඔබතුමිය ලිහිණි මන්ත්‍රීතුමිය මම අවසානේ කියපු එක තියෙනවානේ. මේක කොහොමද මේ 84 රීතියෙන් 1552/6 කියන එකෙන් ඒ ගැසට් එකෙන් කොහොමද අපිව විගණනය කළේ මාව කෝප් එකට ගෙනිච්චොත් මම කියන්නේ පළාත් සභාවක් නැති වෙලාවේ නිකුත් කරපු මේ ගැසට් එකෙන් අපිව විගණනය කරපු එක වැරදි කියලා. අද මේ විශේෂ රැස්වීමට සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටම ස්තූතිය ප්‍රකාශ කරමින් අද දින රැස්වීමේ වැඩකටයුතු අවසන් කරනවා.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

ඒ.කලේඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති
මොරටුව මහා නගර සභාව
මොරටුව

2022.11.01 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.